# වාර්ෂික වාර්තාව

# 2015



## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

# වාර්ෂික වාර්තාව

## 2015

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

41/1, නව පාර්ලිමේන්තු පාර,

පැලවත්ත,

බත්තරමුල්ල.

දුරකථන අංකය: 011 2786495

ෆැක්ස් අංකය:011 2786493

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

41/1, නව පාර්ලිමේන්තු පාර,

පැලවත්ත,

බත්තරමුල්ල.

2017 අප්‍රේල් මස 20 වන දින දී.

ගරු ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

මාලිගාවත්ත

කොළඹ 10.

මැතිතුමනි,

1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ ප්‍රතිපාදන යටතේ 2015 ජනවාරි මස 01 වන දින සිට 2015 දෙසැම්බර් මස 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා වූ ආයතනයේ කටයුතු සම්බන්ධ පහත වාර්තා මේ සමඟ ඉදිරිපත් කරමි.

- සභාපතිතුමාගේ සමාලෝචනය
- අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව
- ආදායම් ප්‍රකාශය
- ශේෂ පත්‍රය
- විගණකාධිපතිගේ වාර්තාව

මෙයට - විශ්වාසි

**නිතිඥ උපාලි මොහොට්ටි**
සභාපති

# ආයතනික තොරතුරු

**ආයතනයේ නම**

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

**අධ්‍යක්ෂ මණ්ඩලය**

| | | |
|---|---|---|
| 1. | නීතිඥ උපාලි මොහොට්ටි මහතා | - සභාපති |
| 2. | කේ. ජී. ඒ. ගුණරත්න මහතා | - අධ්‍යක්ෂ |
| 3. | ඩබ්. අයි. දීපාල් පීරිස් මහතා | - අධ්‍යක්ෂ |
| 4. | නීතිඥ වී. බී. ආර්. වීරකෝන් මහතා | - අධ්‍යක්ෂ |
| 5. | නෙල්සන් ඩබ්. අබේගුණවර්ධන මහතා | - අධ්‍යක්ෂ |
| 6. | ආචාර්ය අනිල් ප්‍රේමරත්න මහතා | - අධ්‍යක්ෂ |
| 7. | අබ්දුල් මජීඩ් මහතා | - අධ්‍යක්ෂ |
| 8. | එම්.සී.එල්. ප්‍රනාන්දු මහතා | - අධ්‍යක්ෂ |
| 9. | හිරංසා කළුතන්ත්‍රි මහත්මිය | - අධ්‍යක්ෂ |
| 10. | පී. එච්. හඳුන්හේවා මහතා | - අධ්‍යක්ෂ |

**ප්‍රධාන කාර්යාලය**

41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල

**විගණක**

විගණකාධිපති දෙපාර්තමේන්තුව

**බැංකුකරුවෝ**

මහජන බැංකුව, බත්තරමුල්ල

ලංකා බැංකුව, පැලවත්ත

# සභාපතිගේ සමාලෝචනය

2015 දෙසැම්බර් 31 දිනට අවසන්වන වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

## හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 2015 ජනවාරි මස 01 දින සිට ආරම්භ වූ මාස 12ක කාල සීමාව තුළ පසුගිය වර්ෂවල මෙන්ම කාර්ය සාධනයෙහි දියුණුවක් පෙන්නුම් කරන ලදි.

## මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය

වගුව 1 - පසුගිය වර්ෂවල මිරිදිය ධීවර හා ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය

| වර්ෂය | මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනය (මෙ.ටො.) | වෙරළබඩ ජලජීවී වගාව තුළින් ඉස්සන් නිෂ්පාදනය (මෙ.ටො.) | මුළු නිෂ්පාදනය (මෙ.ටො.) | පසුගිය වසරට වඩා නිෂ්පාදනයෙහි ඉහළයාම ප්‍රතිශතයක් ලෙස(%) |
|---|---|---|---|---|
| 2008 | 42,270 | 2,220 | 44,490 | 16 |
| 2009 | 43,010 | 3,550 | 46,560 | 2 |
| 2010 | 48,930 | 3,480 | 52,410 | 13 |
| 2011 | 55,410 | 4,150 | 59,560 | 14 |
| 2012 | 65,640 | 3,310 | 68,950 | 16 |
| 2013 | 62,480 | 4,430 | 66,910 | -3 |
| 2014 | 70,600 | 5,150 | 75,750 | 13 |
| 2015 | 60,210 | 7,090 | 67,300 | -11 |

2015 වර්ෂයේ මිරිදිය ධීවර හා ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටොන් 67,300 ක් වූ අතර එය ඉලක්කගත මත්ස්‍ය නිෂ්පාදනයෙන් වඩා 79%කි. 2015 වර්ෂයේ නිත්‍ය ජලාශ වල වගා පාදක ධීවර කර්මාන්තයෙන් ලැබූ මත්ස්‍ය නිෂ්පාදනය 2014 හා සසඳන විට අඩු වී ඇත. 2015 වර්ෂයේ පැවති අහිතකර කාලගුණික තත්ත්වයෙන් ජලාශවල ඉහල ජල මට්ටමක් පැවති කාලය වැඩි වූ අතර මේ නිසා මසුන් ජලාශයන්හි පවතින මියගිය ශාක කොටස් අතරට විසිරීම නිසා ධීවරයින්ට මත්ස්‍ය දැල් යෙදිය හැකි ප්‍රදේශ අවම වීම ද 2014 වසරේ දී ජලාශයන්හි මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම අඩු වීම ද මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය අඩු වීමට හේතු විය. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසු කීටයන් ජලාශ වල තැන්පත් කිරීම වැඩි කිරීම, ප්‍රජා සහභාගිත්වයෙන් ජලාශ කළමනාකරණය, මත්ස්‍ය බීජ නිෂ්පාදනය වැඩි කිරීම ආදී පියවර රැසක් ගන්නා ලදි. තව ද කිවුල්දිය ඉස්සන් වගාව ව්‍යාප්ත කිරීම, යහපත්

කළමනාකරණ පුරුදු අනුගමනය කිරීම තුලින් රෝග පාලනය මගින් කිවුල්දිය ඉස්සන් නිෂ්පාදනය මෙම වසර තුල දි 38%කින් වැඩි වී ඇත.

## විදේශ විනිමය ඉපයීම හා ග්‍රාමීය ආර්ථිකය සඳහා දායකත්වය

2015 වසරේ මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් නිෂ්පාදන වටිනාකම රු. මිලියන 13,640 ක් පමණ ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එමගින් ග්‍රාමීය ආර්ථිකයට අතිමහත් දායකත්වයක් කර ඇත.තවද වගා කරන ලද ඉස්සන් සහ විසිතුරු මත්ස්‍ය අපනයනය තුලින් පිලිවෙලින් රු. මිලියන 1,971 ක් සහරු. මිලියන 2,392 ක විදේශ විනිමයක් උපයා ඇත.

## මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය හා බෙදා හැරීම

2015 වසරේ දි උඩවලව, දඹුල්ල, ඉඟිණියාගල, පොළොන්නරුව, ඉරණමඩුව සහ නුවරඑළිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයන්හි නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ඇසිත්තන් සංඛ්‍යාව මිලියන 88.31කි. මෙම ඇසිත්තන්ගෙන් වැඩි ප්‍රමාණයක් මත්ස්‍ය ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම සඳහා පෞද්ගලික පොකුණු සහ ප්‍රජා පාදක සංවිධාන විසින් කළමනාකරණය කරන මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සඳහා නිකුත් කර ඇත. මෙය 2014 වසරේ ඇසිත්තන් නිෂ්පාදනය හා සසඳන කල 16% නිෂ්පාදනය ඉහල යාමකි.

වගුව 2 - ඇසිත්තන් නිෂ්පාදනය සහ බෙදා හැරීම (2009- 2015) (මිලියන)

| නිෂ්පාදන ඒකක | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
| **ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක සඳහා** | 17.34 | 15.79 | 17.55 | 10.85 | 12.52 | 6.57 | 11.90 |
| **ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවල ඇඟිල්ලන් නිෂ්පාදනය සඳහා** | 13.32 | 16.14 | 28.80 | 40.05 | 62.74 | 55.39 | 50.79 |
| **පෞද්ගලික පොකුණු හිමියන් සඳහා** | 17.99 | 26.31 | 34.88 | 24.39 | 21.94 | 11.93 | 15.67 |
| **කුඩු සඳහා** | 1.35 | 2.30 | 1.88 | 1.11 | 0.84 | 2.02 | 9.95 |
| **එකතුව** | **50.00** | **60.54** | **83.11** | **76.40** | **98.04** | **75.91** | **88.31** |

## මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය

2015 වර්ෂය තුළ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන,ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක හා පෞද්ගලික පොකුණු වල මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 55.21 ක් නිපදවන ලදි. මෙය 2014 වසරේ ඇසිත්තන් නිෂ්පාදනය හා සසදන කල කැපී පෙනෙන (35%) වැඩිවීමකි.

වගුව 3 - මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය (2009 - 2015) (මිලියන)

| නිෂ්පාදන ඒකක | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
| ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක සඳහා | 8.14 | 8.03 | 8.47 | 5.63 | 5.76 | 4.27 | 7.24 |
| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල ඇඟිල්ලන් නිෂ්පාදනය සඳහා | 9.62 | 13.75 | 20.35 | 21.18 | 34.94 | 30.94 | 39.65 |
| පෞද්ගලික පොකුණු හිමියන් සඳහා | 8.99 | 11.70 | 14.89 | 9.87 | 8.43 | 4.81 | 6.06 |
| කුඩු සඳහා | 1.18 | 1.40 | 1.11 | 0.71 | 0.26 | 0.96 | 2.26 |
| **එකතුව** | **27.93** | **34.88** | **44.82** | **37.39** | **49.39** | **40.98** | **55.21** |

## මත්ස්‍ය ඇඟිල්ලන් බෙදා හැරීම

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන, පෞද්ගලික පොකුණු, ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක සහ කුඩු මඟින් 2015 වසරෙහි නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ඇඟිල්ලන් ජලාශවල තැන්පත් කිරීම පිළිබඳ විස්තර පහත පළවේ. 2015 වසර තුල වැඩි මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණයක් තැන්පත් කිරීම තුලින් 2016 වසරේ මිරිදිය ධීවර හා ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීමට ඉවහල් වේ.

වගුව 4 - මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම - 2015

| ජලාශ වර්ගය | ජලාශ සංඛ්‍යාව | මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම (මිලියන) |
|---|---|---|
| විශාල පරිමාණ ජලාශ | 32 | 11.70 |
| මධ්‍යම පරිමාණ ජලාශ | 66 | 16.30 |
| කුඩා පරිමාණ ජලාශ | 257 | 15.94 |
| කාලීන ජලාශ | 453 | 7.07 |
| පොකුණු | 654 | 2.01 |
| ගංගා සහ කලපු | - | 0.67 |
| **එකතුව** | **1,462** | **53.69** |

## මිරිදිය ඉස්සන් පසු කිටයන් නිෂ්පාදනය

පම්බල හා කහඳමෝදර තිල්ලවටවන පිහිටි අභිජනනාගාර මඟින් 2015 වසර තුළ මිරිදිය ඉස්සන් පසු කිටයන් මිලියන 25.57ක් නිපදවන ලද අතර අදාල වර්ෂය තුල දි තැන්පත් කිරීම් පහත දක්වා ඇත.

වගුව 5 - මිරිදිය ඉස්සන් පසු කිටයන් තැන්පත් කිරීම - 2015

| ජලාශ වර්ගය | ජලාශ සංඛ්‍යාව | තැන්පත් කරන ලද පසු කිටයන් (මිලියන) |
|---|---|---|
| **විශාල පරිමාණ ජලාශ** | 20 | 8.78 |
| **මධ්‍යම පරිමාණ ජලාශ** | 36 | 6.54 |
| **කුඩා පරිමාණ ජලාශ** | 51 | 5.34 |
| **කාලීන ජලාශ** | 10 | 0.14 |
| **පොකුණු** | 43 | 0.40 |
| **කලපු** | - | 1.07 |
| **එකතුව** | **160** | **22.27** |

ජලාශවල මිරිදිය ඉස්සන් නිෂ්පාදනය ක්‍රම ක්‍රමයෙන් වර්ධනයක් පෙන්නුම් කරන අතර මෙය ධීවරයන්ගේ ආදායම් ඉහළ යාමට හේතු වී ඇත. ජලාශවල මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 2015 වසර තුල මෙට්‍රික්ටොන් 374ක් පමණ වූ අතර එමඟින් ග්‍රාමීය ආර්ථිකයට කරනු ලැබූ දායකත්වය රුපියල් මිලියන 337 ක් පමණ වේ. මිරිදිය ඉස්සන් ජාලශ ආශ්‍රිතව නව ධීවර කර්මාන්තයක් බිහි කර ඇති අතර මේ සඳහා අපනයන වෙළඳපලක් ද ඇති වී ඇත. මේවනවිට ආයතන දෙකක් මිරිදිය ඉස්සන් අපනයනය කරන අතර මෙ. ටොන් 21.36, 20.68 141 සහ 144 ක් පිළිවෙලින් 2012, 2013, 2014 සහ 2015 වර්ෂ වල අපනයනය කර ඇත.

## නොමිලයේ මත්ස්‍ය පැටවුන් නිකුත් කිරීමේ වැඩසටහන

2008.07.16 දින දරන අමාත්‍ය මණ්ඩල තිරණයට අනුකුලව වසර පහක කාලයක් සඳහා මත්ස්‍ය පැටවුන් නිකුත් කිරිමේ වැඩ සටහන 2009 වසරෙහි දි ආරම්භ විය. මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 150.0 ක් වෙන් කර තිබුණි. 2015 වර්ෂයේ මේ සඳහා රුපියල් මිලියන 30.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි.

මෙම වැඩසටහන යටතේ මත්ස්‍ය ඇඟිලිලන් සහ මිරිදිය ඉස්සන් පසු කිටයන් මිලියන 29.68 ක් 2015 වසර තුළ ජලාශවල තැන්පත් කර ඇත.

## ජලාශවල ධීවර කළමනාකරණ කටයුතු

තිත්‍යානුකුල නොවන ධීවර ආම්පන්න භාවිතය වලක්වා ජලාශවල මිරිදිය ධීවර කටයුතු නියාමනය සහ කළමනාකරණය කිරිම සඳහා අප අධිකාරිය 2015 වසර තුළවැටලිම් 232 ක් සිදුකර ඇත. මීට අමතරව කළමනාකරණ බලපත්‍ර 194ක් ද මිරිදිය ධීවර කර්මාන්තය සඳහා යාත්‍රා 253 ක් සහ ධීවර ආම්පන්න කට්ටල 900 ක් ලබා දි ඇත.

## ඉස්සන් වගා කර්මාන්තය

සුදුපුල්ලි රෝගය හේතු කොටගෙන හානියට පත්වූ ඉස්සන් වගා කර්මාන්තය පුනරුත්ථාපනය කිරිම සඳහා පසුගිය වසර කිහිපය තුළවිවිධ වැඩසටහන් ඉස්සන් ගොවිපල අධීක්ෂන ඒකකය මඟින් ක්‍රියාත්මක කරන ලදි. එකී ක්‍රියාකාරකම් අතර ලන්දේසි ඇල හැරීම, කලාප වෙන් කිරීමසහ වගා කාලසටහන් හඳුන්වා දිම, අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, ඉස්සන් අභිජනනාගාර නියාමනය සහ ඉස්සන් පසු කිටයන් සහ මව් ඉස්සන් පරීක්ෂාවට යටත් කිරීම ද ප්‍රධාන වේ. ඒ හැරුණු විට බත්තුළුඔය පිහිටි ඉස්සන් රෝගනිර්ණය සහ සෞඛය කළමනාකරණ විද්‍යාගාරය ඉස්සන් වගා කරුවන් සඳහා රෝග නිර්ණයනය සඳහා සේවා සපයනු ලබයි.

ජලජීවී වගා කළමනාකරණ බලපත්‍ර 345 ක් නිකුත් කරන ලද අතර මින් 328 ක් ඉස්සන් ගොවිපල සඳහා ද 15ක් ඉස්සන් අභිජනනාගාර සඳහා ද 02ක් මව් ඉස්සන් එකතු කරන්නන් සඳහා දනිකුත් කරන ලදි. නැක්ඩා ආයතනය 2015 වසර තුල ඉස්සන් පසු කිටයන් සහ මව් මත්ස්‍යයින්ගේ රෝග සඳහා PCR පරීක්ෂණ 4216 ක් සිදුකර ඇති අතර මෙම පරීක්ෂණ බත්තුළුඔය ස්ථාපිත ඉස්සන් රෝග නිර්ණය සහ සෞඛය කළමනාකරණ විද්‍යාගාරය මගින් සිදුකරනු ලැබේ .

2015 වසරෙහි දි පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් අභිජනනාගාර 42 ක් සහ ඉස්සන් ගොවිපල 608 ක් ක්‍රියාත්මක විය. අදාල වර්ෂය තුළ ඉස්සන් පසු කිටයන් නිෂ්පාදනය මිලියන 463 කි.

උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට ඉස්සන් වගාව පොකුරු වගා ක්‍රමය යටතේ ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇති අතර මේ සඳහා සුදුසු ඉඩම් හඳුනාගෙන ඇත. මඩකලපුව දිස්ත්‍රික්කය තුල ඉස්සන් වගාව බිම් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වෙමින් පවති.

## මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉස්සන් වගාව සංවර්ධනය කිරීම

මෙම අභිජනනාගාරය රාජ්‍ය - පෞද්ගලික ව්‍යවසායයක් යටතේ 2011 දි නිෂ්පාදන ආරම්භ කල අතර මෙමගින් මඩකලපුව ප්‍රදේශයේ සඳහා අවශ්‍ය පසු කිටයන් සැපයීම සිදුකරනු ඇත. පෞද්ගලික සමාගමක් මෙම අභිජනනාගාරය පවත්වාගෙන යන අතර 2015 දි ඉස්සන් පැටවුන් මිලියන 21 නිෂ්පාදනය කර ඇත. තවද මඩකලපුව දිස්ත්‍රික්කයේ ව්‍යාප්ත වෙමින් පවතින ඉස්සන් වගා කර්මාන්තය සඳහා අවශ්‍ය *කිවුල්දිය ඉස්සන්* පසු කිටයන් අවශ්‍යතාවය සපුරාලීමට නැගෙනහිර පළාතේ ස්ථාපිත එකම අභිජනනාගාරය වේ.

වාකරේ ප්‍රදේශයේ සුනාමියේ බලපෑමට ලක්වූ පවුල් සඳහා පොකුරු ක්‍රමයට ඉස්සන් වගා කිරීම තුලින් ජිවනෝපාය සංවර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලදි. අධිකාරිය විසින් පහසුකම් සලසා දුන් මඩකලපුව, වාකරේ පිහිටා ඇති පොකුරු ඉස්සන් වගා ගොවිපල, පරිසර හිතකාමී වුත් තිරසාර වුත් කිවුල්දිය ඉස්සන් වගාව සඳහා ආදර්ශ ගොවිපලකි. ප්‍රතිලාභින් සහ ආයෝජකයකු අධිකාරිය සහ වාකරේ දිස්ත්‍රික් ලේකම් විසින් තෝරා ගත් අතර සියළුම ප්‍රතිලාභින් සාමාජිකත්වය දරන ජලජීවි සංවර්ධන සංගමයක් පිහිටුවා එය අධිකාරියේ ලියාපදිංචි කරන ලදි. ආයෝජක ආයතනය සහ සංගමය කොටස්කරුවන් වන සේ Vakarai Ocean Aqua Cluster (Pvt) Ltd ආයතනය පිහිට විය. මෙම පොකුරු ඉස්සන් වගා ගොවිපල Vakarai Ocean Aqua Cluster (Pvt) Ltd යටතේ ක්‍රියාත්මක වේ. 2015 වර්ෂය තුල පසු කිටයන් මිලියන 5.19ක් තැන්පත් කර ඇති අතර මෙ. ටොන් 96.87 ක අස්වැන්නක් ලබා ගෙන ඇත.

මඩකලපුව ගුවන් හමුදා කඳවුර තුල පිහිටා ඇති මෙම ප්‍රදර්ශක ගොවිපල උපයෝගි කරගෙන ජලජිවි වගා සංවර්ධන අධිකාරියේ නිලධාරින් සහ ප්‍රදේශයේ ඉස්සන් වගා කරුවන්ගේ යහපත් කළමනාකරණ පුරුදු සහ තිරසාර ඉස්සන් වගාව පිළිබඳව පුහුණු කරනු ලැබේ. දැනට මෙම ප්‍රදර්ශක ගොවිපල මඩකලපුව ගුවන් හමුදා කඳවුර මඟින් කළමනාකරණය කරනු ලැබේ. 2015 වර්ෂය තුල පසු කිටයන් මිලියන 0.33ක් තැන්පත් කර ඇති අතර මෙ. ටොන් 5.56 ක අස්වැන්නක් ලබා ගත් අතර තව ද වගාකරුවන් 63 දෙනෙකු පුහුණු කර ඇත.

## විසිතුරු මසුන් සහ ජලජ පැළෑටි වගාව

නැක්ඩා ආයතනය විසින් මසුන්ගේ නව ප්‍රභේද බිහිකිරිම, තාක්‍ෂණ සංවර්ධනය, මව් මසුන් සැපයීම, මත්ස්‍ය රෝග නිර්ණයන,පුහුණුව සහ තාක්‍ෂණ උපදෙස් සැපයීම යනාදිය මඟින් විසිතුරු මසුන් හා

ජලජ පැලෑටි වගාව මෙන්ම අපනයන සඳහා සහාය වෙනු ලබයි. රම්බඩගල්ල සහ ගිණිගත්හේන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන විසිතුරු මසුන් සහ ජලජ පැලෑටි වගාව සංවර්ධනයට අදාල කාර්යයන් සඳහා වෙන්කර ඇත. මෙම මධ්‍යස්ථාන මඟින් විසිතුරු මසුන් මිලියන 2.05 ක් ගොවින්ට හා අපනයන කරුවන්ට අළෙවිකර රුපියල් මිලියන 7.59 ක් උපයන ලදි.මව් මසුන් 54,420 ක්ද මෙම වර්ෂය තුළ සපයා ඇත. අදාල වර්ෂය තුළ පුහුණු පාඨමාලා 18ක් පවත්වන ලද අතර ඒ මඟින් විසිතුරු මසුන් වගා ක්ෂේත්‍රයේ 564 දෙනෙකු පුහුණු කර ඇත.

විසිතුරුජලජ පැලෑටි පටක රෝපණය සඳහා රම්බඩගල්ල මධ්‍යස්ථානයේ පටක රෝපණ විද්‍යාගාරයක් පිහිටුවා ඇත. මෙහි මූලික අරමුණ වනුයේ තාක්ෂණික සහ ජලජ පැලෑටි අපනයනය තුලින් විදේශ විනිමය ඉපයීමය. 2015 වසරේ නිෂ්පාදිත ජලජ පැලෑටි සංඛ්‍යාව 33,675 කි.

Live rock අපනයනය අපගේ නිෂ්පාදන පරාසය සඳහා නව එකතුවීමක් වන අතර 2015 වර්ෂයේ දිරුපියල් මිලියන 14.61ක වටිනාකමකින් යුත් Live rock අපනයනය කර ඇත.

## සාම්ප්‍රදායික නොවන ජලජීවී වගාවන්

- **මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරය**

  පෞද්ගලික අභිජනනාගාරයක වියට්නාම රජයේ තාක්ෂණික සහයෝගිතාව යටතේ මුහුදු කුඩැල්ලන් අභිජනන තාක්ෂණය හඳුන්වා දෙන ලදි. 2015 වසර තුලදී මුහුදු කුඩැල්ලන් පැටවුන් 239,000 ක් නිෂ්පාදනය කර ඇත.

- **මුහුදු කුඩැල්ලන් වගාව**

  කොටු සහ පොකුණු වල මුහුදු කුඩැල්ලන් වගාව සඳහා අප ආයතනය පහසුකම් සපයා ඇති අතර පෞද්ගලික අංශය විසින් තේවාන්පිටිටි, අම්බුපුරම්, වලෙයිපාඩු සහ නාච්කුඩා යන ප්‍රදේශ වල මුහුදු කුඩැල්ලන් වගාව ආරම්භ කර ඇත. 2015 වසරේ දී මුහුදු කුඩැල්ලන් මෙ.ටොන් 53ක (තෙත් බර) අස්වැන්නක් ලබා ගෙන ඇත.

- **මුහුදු පැළෑටි වගාව**

  වියට්නාම රජයේ තාක්ෂණික සහයෝගිතාව යටතේ මුහුදු පැළෑටි වගා කිරීමේ නියාමක ව්‍යාපෘතියක් කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ මොනෝලයින් (Monoline) ක්‍රමය යටතේ කැපෆයිකස් (Kappaphycus) නමැති මුහුදු පැළෑටිය වගා කිරීමේ

තාක්ෂණය හඳුන්වා දෙන ලදි. මේ වනවිට පෞද්ගලික සමාගමක් උතුරු පළාතේ ප්‍රදේශ කිහිපයක ප්‍රජා සහභාගිත්වයෙන් මුහුදු පැළෑටි වගාව අරඹා ඇත. මේ වනවිට වගාකරුවන් 1000ක් පමණ මුහුදු පැළෑටි වගාවේ නිරතව ඇත. දින 45ක වගා චක්‍රයකින් එක් පවුලක් රුපියල් 45,000ක් ආදායමක් උපයයි. එම සමාගම මේ වනවිට අපනයනය ද ආරම්භ කර ඇති අතර 2015 වසරේ මුහුදු පැළෑටි මෙ.ටොන් 165 ක් (වියළි බර) අපනයනය කර රු. මිලියන 16.5 උපයා ඇත.

- **මොදා අභිජනනාගාරය**

රාජ්‍ය - පෞද්ගලික ව්‍යවසායයක් යටතේ මොදා මත්ස්‍ය අභිජනනය සාර්ථක කර ගැනිමට හැකි විය. පෞද්ගලික අභිජනනාගාරයක මොදා මත්ස්‍ය අභිජනනය සඳහා තාක්ෂණික සහය ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙන ලදි. මෙය ශ්‍රී ලංකාව තුල මොදා මත්ස්‍ය වගාව ව්‍යාප්ත කිරීම සඳහා මග පාදනු ඇත. 2015 වර්ෂයේමොදා පැටවුන් 250,000 නිෂ්පාදනය කර ඇත.

- **මොදා මත්ස්‍ය වගාව**

මීගමුව කළපුව, ත්‍රිකුණාමලය, ගාල්ල, හා පුත්තලම යන දිස්ත්‍රික්කවල මොදා මත්ස්‍ය වගාව සඳහා පුද්ගලික අංශය යොමු වී ඇත. මේ වනවිට වගාකරුවන් 80 දෙනෙකු පමණ පොකුණු හා කූඩු තුල මොදා මසුන් වගාවේ නියැලී සිටී. 2015 වර්ෂයේමොදා පැටවුන් 327,665 තැන්පත් කර ඇති අතර මෙ.ටොන් 36.50 ක මොදාඅස්වැන්නක් ලබා ගෙන ඇත.

ඇමරිකානු ඩොලර් මිලියන 04 ක වියදමින් මහා පරිමාණ කූඩු තුල මොදා මත්ස්‍ය වගා ව්‍යාපෘතියක් පෞද්ගලික සමාගමක් විසින් ත්‍රිකුණාමල මුහුදේ ආරම්භ කරන ලදි. වානිජ මට්ටමින් මුහුද ආශ්‍රිත මත්ස්‍ය වගාව රටට හඳුන්වා දීම මෙමගින් සිදුවේ. තවද මෙම ව්‍යාපෘතිය මගින් සෘජු රැකියා ඇති කිරීම තුලින් වෙරළබඩ ජනතාවගේ ජීවනෝපාය ඇති කිරීම, ස්වාභාවික මත්ස්‍ය ගහණය වෙත වන බලපෑම අවම වීම, නොකඩවා මත්ස්‍ය නිෂ්පාදනය අපනයන වෙළඳපලට සැපයීම මගින් විදේශ විනිමය වැඩි කිරීම, සංචාරකයින්ගේ ආකර්ෂණය ලබා ගැනීම බලාපොරොත්තු වේ.2015 වර්ෂයේමොදා පැටවුන් 350,131 තැන්පත් කර ඇති අතර මෙ.ටොන් 20 ක මොදා අස්වැන්නක් ලබා ගෙන ඇත.

## ඉරණමඩු ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන

ඉරණමඩුව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නිෂ්පාදන කටයුතු ආරම්භ විය. මේ සඳහා වූ වියදම රු.මි. 386කි. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම තුලින් පෝෂණ මට්ටම සහ ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීම සඳහා උතුරු පලාතේ ජලාශ වලට මත්ස්‍ය ඇඟිල්ලන් ලබා දීම මෙහි අරමුණු වේ.

## මුහුදු මත්ස්‍ය අභිජනනාගාර, මඩකළපුව

ශ්‍රී ලංකාවේ මුහුදු මත්ස්‍ය වගාව සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මුහුදු මත්ස්‍ය බීජ නිෂ්පාදනය කිරීමේ මූලික අරමුණ ඇතිව මඩකළපුව දිස්ත්‍රික්කයේ මුහුදු මත්ස්‍ය අභිජනනාගාරයක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර ඇත. මෙම ඉදිකිරීම FAO ආයතනයේ ප්‍රතිපාදන මගින් සිදුකරන අතර ඇස්තමේන්තු කර ඇති වියදම රු. මිලියන 120 කි. වේක්කයා Milk fish *(Chanos chanos)*, මොදා Barramundi/Asian sea bass *(Lates calcarifer)*,Sea bream (*Pagrus major),* Mahi mahi (*Coryphaena hippurus),* Cobia *(Rachycentron canadum)*යන මත්ස්‍යයින් අභිජනනය සඳහා තෝරා ගෙන ඇත. වෙරළබඩ ජීවත්වන පවුල් 1600 ක පමණ ජීවනෝපාය සංවර්ධනය, මත්ස්‍ය බීජ රට තුල නිපදවීම, අපනයන ආදායම වැඩිකිරීම, මුහුදු මත්ස්‍ය වගාකරුවන්ගේ මත්ස්‍ය බීජ වියදමඅවම මට්ටමක පවත්වා ගැනීම සහ තාක්ෂණය ලබා දීම මෙමගින් බලාපොරොත්තු වේ.

## ආසියා ශාන්තිකර කලාපීය නීල වර්ධනය (Blue Growth) සඳහා වූ තිරසාර ත්‍රීව ජලජීවී වගාව සඳහා වූ ආරම්භක ව්‍යාපෘති (ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය)

- **ජලාශ්‍රිත මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක පිහිටුවීම**

ජලාශවල මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධානතම සාධකයක් වී ඇත්තේ මත්ස්‍ය බීජ නිෂ්පාදනයයි. මේ වනවිට සමස්ථ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය මිලියන 50ක් පමණ වන අතර මින් 90%ක් පමණම නිපදවන්නේ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වලින් වන අතර ඉතිරිය ප්‍රජා මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක හා කුඩා පරිමාණ වගාකරුවන් විසින් නිපදවනු ලබයි. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සඳහා සියළුම මිරිදිය ජලාශ වලට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය මිලියන 150ක් පමණ බව ඇස්තමේන්තු කර ඇත. මේ සඳහා වගා පාදක ධීවර කර්මාන්තයේ නියලී සිටින ධීවර සංවිධාන මගින් මත්ස්‍ය බීජ නිෂ්පාදනය සිදුකිරීමට සැලසුම් කර

ඇති අතරජලාශ්‍රිත මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක 05ක් නිත්‍ය ජලාශ 05ක් ආශ්‍රිතව පිහිටවීමට FAO ආයතනය ඇමරිකානු ඩොලර් 150,000 ක ප්‍රතිපාදන ලබා දී ඇත. මේ යටතේ ජලාශ්‍රිත මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක පිහිටවීමට අවශ්‍ය තාක්ෂණික සහාය, පුහුණු කිරීම්, අමු ද්‍රව්‍ය සහ උපකරණ ලබා දෙනු ලැබේ.

- ***"Aquaculture value chain development"* සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම**

නිෂ්පාදන සඳහා වෙළඳපොල සහ ජලජීවී වගාව සඳහා යෙදවුම් සැපයීමේ ගැටළුව නිසා ශ්‍රී ලංකාවේ *Aquaculture value chain*ප්‍රමාණවත් ලෙස ස්ථාපිත නොවීමට බලපෑ ඇත. අස්වැන්න වැඩි කාලයේදී සමහර ප්‍රදේශ වල නිෂ්පාදන විකුණා ගැනීම අපහසු වන අතර වගාකරුවන් බොහෝමයකට තත්ත්වයෙන් උසස් මත්ස්‍ය බීජ හා ආහාර ලබා ගැනීමේ ගැටළුවක් පවතී. ශ්‍රී ලංකාවේ ජලජීවී වගා සංවර්ධනය සඳහා ප්‍රධානම බාධකයක් වී ඇත්තේ aquaculture value chainක්‍රමානුකූලව සංවර්ධනය නොවීමය. කුඩා පරිමාණ වගාකරුවන් වෙළඳපල වෙත යොමු කිරීම හා පාරිභෝගිකයන් සහ යෙදවුම් සැපයීම වැඩිදියුණු කිරීම සඳහා ජාතික උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම මගින් කුඩා පරිමාණ වගාකරුවන්ගේ ආදායම වැඩි කිරීම සහ පාරිභෝගියන් වෙත ජලජීවී නිෂ්පාදන ලබා දීම මෙහි මූලික අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය සඳහා FAO ආයතනය ඇමරිකානු ඩොලර් 20,000 ක මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත.

- **මත්ස්‍ය ජාන සහ මවි මත්ස්‍ය ගහණය කළමණාකරනය සඳහා තාක්ෂණික සහාය ලබා දීම**

ග්‍රාමීය වගාකරුවන් සඳහා තත්ත්වයෙන් උසස් ජානමය වැඩිදියුණු කල මත්ස්‍ය බීජ ලබා දීම තුලින් ජලජීවී වගාව තිරසාර කිරීම මෙහි අරමුණ වන අතර ආයතනය මේ සඳහා ඩොලර් 360,000 ක ප්‍රතිපාදන ලබා දී ඇත.

- ***කිවුල්දිය ඉස්සන් සඳහා* Acute Hepatopancreatic Necrosis Disease (AHPND) *රෝගය ඇති වීමට ඇති අවදානම අවම කිරීම සහ කළමනාකරණය කිරීම***

Acute Hepatopancreatic Necrosis Disease (AHPND)හෝ වඩාත් ප්‍රචලිතව ඇති Early Mortality Syndrome (EMS) රෝගය *කිවුල්දිය ඉස්සන් සඳහා මතු වී ඇති රෝගකාරකයකි.*මෙම රෝගය පිළිබඳ දැනුවත් කිරීම සහ නවතම තොරතුරු ලබා දීම, රෝගය මැනවින් අවබෝධ කර ගැනීම සඳහා පදනමක් ඇති කිරීම සහ ප්‍රායෝගික පාලන ක්‍රියාමාර්ග ඇති කිරීම සඳහා FAO ආයතනය

ඇමරිකානු ඩොලර් 422,000 ක වියදමින් අන්තර් කලාපීය ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. FAO Aquatic Animal Health (AAH) Capacity and Performance Self-Assessment සමීක්ෂණයක් ක්‍රියාත්මක කල අතර දැනුවත් කිරීමසහනවතම විද්‍යාත්මක තොරතුරු ලබා දීම සඳහා අන්තර් කලාපීය වැඩමුළු දෙකක් ජුනි 22-27 දක්වා පැනමා හිදි පැවැත්විය. මෙම වැඩමුළුවේ දි ශ්‍රී ලංකාවේ රෝගය ඇති වීම වැලක්වීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් ද සකස් කරන ලදි

රටපුරා විසිරී සිටින මිරිදිය ධීවරයන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නංවාලීම සඳහා සෑම අවස්ථාවකම කැපවීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ කාර්යය මණ්ඩලයේ කර්තව්‍යයන් ඉතා ඉහළින් අගයන අතර ඔවුන් දක්වන ලද සහයෝගය සම්බන්ධයෙන් සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය හිමිවේ. ඒ සමගම ආධාර ලබාදෙන ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ පළාත් සභා, ජලාශ ධීවරසංවිධාන සඳහා මත්ස්‍ය බීජ සැපයීම සඳහා අරමුදල් සැපයීමෙන් දක්වන ලද සහයෝගය මෙහිදි විශේෂයෙන් සඳහන් කරමු. එමෙන්ම ජලජීවී වගාවේ වගා කරුවන්, ඉස්සන් වගා කරුවන්, අපනයන කරුවන් සහ අනෙකුත් අනුග්‍රාහකයන්ටද අපගේ ස්තුතිය පල කරමු.

අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර හා ජලජීවී වගාවේ සංවර්ධනය සඳහා දක්වන ලද මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාටත්, ගරු රාජ්‍ය අමාත්‍යතුමාටත් අපගේ ස්තුතිය පල කරමු. අධිකාරියේ කටයුතු සඳහා නිරන්තරයෙන් දක්වන ලද සහාය වෙනුවෙන් අමාත්‍යාංශ ලේකම්තුමිය සහ කාර්යය මණ්ඩලයටත්, ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි කාර්යය සඳහා මූල්‍ය සහාය ලබාදුන් මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාට ද අපගේ විශේෂ ස්තුතිය හිමිවේ.

සභාපති

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව විගණනය කරන ලද ගිණුම්ද සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන්නේ ඉතා සතුටිනි.

# 1. හැඳින්වීම

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති ජලජීවී වගා අංශය 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත මඟින් 1999 ජනවාරි මස 29වන දින පටන් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා - NAQDA) බවට පත් කරන ලදි. ආරම්භයේදි ප්‍රධාන කාර්යාලය කොළඹ 10, ටී.බී ජායා මාවතේ අංක 307 1/1 යන ස්ථානයෙහි කුලියට ලබාගන්නා ලද ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදි. එය 2003 වසරේ සිට කොළඹ 09, බේස්ලයින් පාර පිහිටි ගොඩනැගිල්ලකට ගෙනයන ලද අතර 2010 ජනවාරි මාසයේදි ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල,පැලවත්තේහි පිහිටි අධිකාරිය සඳහා ඉදිකල නව ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ලකට ගෙන එන ලදි.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය සිදු කරනු ලබයි. අධිකාරිය ප්‍රධාන වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් යටතේ මිරිදිය ජලජීවී වගා සංවර්ධන, වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන, ව්‍යාප්ති, මුදල් සහ මානව සම්පත් සංවර්ධන වශයෙන් අංශ 5කින් හා අධ්‍යක්ෂවරු පස් දෙනෙකුගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වේ.

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන(AQDC)**

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මගින් ප්‍රධාන මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන (AQDC) හයක් (07) , මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන දෙකක් (02) සහ විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන දෙකක් (02) පහත ආකාරයට පවත්වා ගෙන යනු ලබයි.

| <u>මධ්‍යස්ථාන</u> | <u>නිෂ්පාදන විශේෂයන්</u> |
|---|---|
| ➢ උඩවලව (කාප්) | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප් |
| ➢ දඹුල්ල | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප් |
| ➢ ඉඟිණියාගල | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, තිලාපියා |
| ➢ නුවරඑළිය | සාමාන්‍ය කාපයා |
| ➢ උඩවලව (තිලාපියා) | තිලාපියා විශේෂ |
| ➢ පොළොන්නරුව | ඉන්දියානු කාප්, චීන කාප්,තිලාපියා |
| ➢ ඉරණමඩුව | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්,තිලාපියා |
| ➢ පම්බල | මිරිදිය ඉස්සන් |

- තිල්ලවටවන (කහඳමොදර) මිරිදිය ඉස්සන්
- රම්බඩගල්ල — විසිතුරු මත්ස්‍ය අභිජනනනය සහ වර්ධනය සහ ඉහත විෂයයන් සම්බන්ධව පුහුණු වැඩසටහන් පැවැත්විම
- ගිනිගත්හේන — විසිතුරු මත්ස්‍ය අභිජනනාගාර හා වගාව

ඉහත සියලු මධ්‍යස්ථානයකම ජලජීවී විද්‍යාඥවරයකු ස්ථානභාර නිළධාර වශයෙන් කටයුතු කරන අතර, ඔවුන්ගේ වගකීම වන්නේ දිවයින පුරා පිහිටි ජලාශවල තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මත්ස්‍ය බීජ නිෂ්පාදනය කිරීමයි.

**කලාවැව - ජාතික මිරිදිය ධීවර සහ ජලජීවී වගා පුහුණු ආයතනය (NIFATI)**

මෙම ආයතනය ජලජීවී වගා අධිකාරියේ කාර්ය මණ්ඩලය, මිරිදිය ධීවරයන්, මසුන් වගා කරන්නන්, රාජ්‍ය නොවන ආයතන, ප්‍රජා මූලික සංවිධාන සහ උනන්දුවක් දක්වන පාර්ශව සඳහා මිරිදිය ධීවර සහ ජලජීවී වගා ක්ෂේත්‍රයට අදාල පුහුණුවීම් පවත්වනු ලබයි. එයට අමතරව රාජ්‍ය හා පෞද්ගලික ආයතනසඳහා පුහුණු වැඩසටහන් පැවැත්විමට අවශ්‍ය පහසුකම් සැලැස්වීමද සිදුකරන අතර ආයතනය සහකාර අධ්‍යක්ෂ (පුහුණු) යටතේ පාලනය වේ.

**ව්‍යාප්ති අංශය**

ප්‍රාදේශිය ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල සහ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල 22ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ (පළාත් හා දිස්ත්‍රික් මට්ටමින්). ප්‍රාදේශිය/දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරීන් ව්‍යාප්ති කටයුතු , රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කටයුතු , ජලජ සම්පත් කළමණාකරනය එනම් ජලාශවල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම, ධීවරයින් දැනුවත් කිරීමේ කටයුතු හා අනවසර ධීවර කටයුතු වැලැක්වීම සහ තාක්ෂණය ලබා දිමේ කටයුතු සිදුකරනු ලබයි.

## 2. <u>අරමුණු</u>

නැක්ඩා ආයතනයේ ප්‍රධාන අරමුණ වන්නේ විධිමත් මඟපෙන්වීම තුලින් ජලජීවී වගා සංවර්ධනයට අවශ්‍ය රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ සහ සංවර්ධනයන්, පුහුණු කිරීම් හා ව්‍යාප්ති කටයුතු යනාදි ක්‍රමවේදයන් තුලින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගාවේ තිරසාර සංවර්ධනයයි. මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම තුලින් ආර්ථික සංවර්ධනය,

ජනගහනයේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම,අපනයන වෙළඳපොලට ඉහළ වටිනාකමක් සහිත මත්ස්‍ය විශේෂ ඉදිරිපත් කිරීම සහ රැකියා අවස්ථා බහුල කිරීමෙන් සහ ආදායම් තත්ත්වය ඉහල දැමීම තුලින් දිලිදුකම අඩුකිරීම නැක්ඩා ආයතනයේ අනෙකුත් අරමුණු වේ.

15/09/2011 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛන අංක 58(2) අනුව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ප්‍රවර්ධන ආයතනයක් (Promotional Institute)ලෙස වර්ගීකරණය කර ඇත.

## 3. 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මිනිස් බලය පිළිබඳ තොරතුරු

| කාණ්ඩ | | සංඛ්‍යාව |
|---|---|---|
| **ප්‍රධාන විධායක නිලධාරී** | | 01 |
| **ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්** | | 04 |
| **මධ්‍ය මට්ටමේ කළමණාකරුවන්** | | 11 |
| **කණිෂ්ට මට්ටමේ කළමණාකරුවන්** | | 69 |
| ජලජීවී විද්‍යාඥයින් | 41 | |
| ප්‍රාදේශිය/දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරීන් | 20 | |
| සංඛ්‍යා ලේඛන නිළධාරීන් | 03 | |
| පරිඝණක විශ්ලේෂක | 01 | |
| මුල්‍ය නිළධාරීන් | 01 | |
| පරිපාලන නිළධාරීන් | 01 | |
| ප්‍රසම්පාදන නිළධාරීන් | 01 | |
| සමාජ සංවර්ධන නිළධාරීන් | 01 | |
| **කළමණාකාර සහකාර - තාක්ෂණික** | | 87 |
| ජලජීවී වගා සහකාර | 16 | |
| ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරීන් | 67 | |
| තාක්ෂණිකනිළධාරීන් | 03 | |
| පොත් තබන්නන් | 01 | |
| **කළමණාකාර සහකාර - තාක්ෂණික නොවන** | | 71 |
| **ප්‍රාථමික මට්ටම** | | **324** |
| විදුලි/ යන්ත්‍ර කාර්මික | 07 | |
| රියදුරු | 42 | |
| සුළු සේවකයින් | 275 | |
| **එකතුව** | | **567** |

## 4. ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වන්නේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ මිරිදිය මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම, රැකියා අවස්ථා බිහි කිරීම, ජලජ සම්පත් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ප්‍රමාණය වැඩි කිරීම ඉලක්ක කර ගෙන ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් සහ ජලජීවී වගා කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සහ කළමනාකරණය කිරීමයි.

## 5. ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 100% ක් භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධනය ආයෝජනය කරනු ලබන රජයේ අයතනයකි. මෙහි අනුමත මූලික ප්‍රාග්ධනය රුපියල් මිලියන 90 කි.

## 6. ආදායම්

මත්ස්‍ය බීජ විකිණීමෙන්,මධ්‍යස්ථාන බදුදීමෙන් හා අනෙකුත් ආදායම් වශයෙන්අධිකාරිය ලබා ඇති ආදායම රුපියල් මිලියන 147.53ක් වේ. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් පියවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබාදුන් අරමුදල් ප්‍රමාණය රුපියල් මිලියන 313.09ක් වේ.

## 7. අධිකාරියේ ක්‍රියාකාරකම්

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන 11.44 ක ශුද්ධ ලාභයක් ලබා ඇත. ආදායම් විස්තර පිටු අංක 24 යටතේ දක්වා ඇත.

## 8. කාර්යයන් පිළිබඳ ප්‍රකාශය

2015 දෙසැම්බර් 31 වන දිනට අධිකාරියේ ශේෂ පත්‍රය 21 වන පිටුවෙහි දක්වා ඇත.

## 9. ප්‍රාග්ධන වියදම්

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙනුවෙන් 2015 වර්ෂයේ දී රුපියල් මිලියන 100.0 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර දී ඇත. මෙම සම්පූර්ණ වෙන් කල ප්‍රතිපාදන භාවිතා කරනු ලැබුවේ මධ්‍යස්ථානවල ඇති ගොඩනැගිලි හා පොකුණු පුනරුත්ථාපනය සහ පිළිසකර කිරීම, ස්ථාවර වත්කම් මිලදී ගැනිම්,වාහන හා උපකරන පුනරුත්ථාපනය සහ ජලජීවී වගා සංවර්ධන කටයුතු සඳහා යෙදවීමටය.

## 10. වෙනත් නියෝජිත ආයතන සමඟ සම්බන්ධතා

ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය යටතේ ජලජීවී වගා ක්ෂේත්‍රයෙහි සංවර්ධන සඳහා විශේෂ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. එයට අමතරව පෞද්ගලික අංශය සමඟ කිවුල්දිය ඉස්සන් අභිජනනාගාරයක්, ආදර්ශ ඉස්සන් ගොවිපලක්, වාකරේ ප්‍රදේශයේ පොකුරු ක්‍රමයට ඉස්සන් වගාව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය, තව ද වියට්නාම් රජය විසින් මුහුදු පැළැටි වගාව, මුහුදු කුඩැල්ලන් අභිජනනය සහ වගාව සහ කකුළුවන් තර කිරීම සඳහා තාක්ෂණය සහ සහාය ලබා දෙන ලදි.

## 11. ආයතනය එළඹ ඇති කොන්ත්‍රාත් කෙරෙහි අධ්‍යක්ෂ වරුන්ගේ මැදිහත් වීම

2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂයතුලදී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ආයතනය එළඹි ඇති කොන්ත්‍රාත්තු සඳහා සෘජුවම හෝ වක්‍රව මැදිහත්වීම් සිදුකොට නැත.

## 12. විගණකවරු

2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ගිණුම් විගණනය කරනු ලද්දේ රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසිනි.

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## ශේෂ පත්‍රය

| | සටහන් | 2015 රු | 2014 රු |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල ,පිරියතර හා උපකරණ | 4 | 823,778,666.93 | 630,849,630.19 |
| අභිජනන ක්‍රියාවලියේ හා වෙළඳ වත්කම් | 5 | 285,364,959.02 | 133,074,104.93 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | | 17,463,020.30 | 47,187,303.03 |
| ජීව වත්කම් | | 99,950.00 | 99,950.00 |
| | | 1,126,706,596.25 | 811,210,988.15 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 6 | 27,383,281.52 | 22,876,016.69 |
| තැන්පතු, අත්තිකාරම් හා කලින් ගෙවීම් | 7 | 3,179,337.56 | 2,989,487.93 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 8 | 65,375,846.72 | 37,938,286.82 |
| මුදල් හා මුදලට සමාන දෑ | 9 | 49,268,312.68 | 11,591,440.47 |
| | | 145,206,778.48 | 75,395,231.91 |
| **මුළු වත්කම්** | | 1,271,913,374.73 | 886,606,220.06 |
| **හිමිකම් හා බැරකම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රාග්ධන හා වෙන් කිරීම් | | | |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන | | 158,514,594.24 | 207,003,656.89 |
| රඳවා ගත් ඉපැයීම් | | (189,882,491.62) | (205,564,085.89) |
| | | 17,400,000.00 | 17,400,000.00 |
| **මුළු හිමිකම්** | | (13,967,897.38) | 18,839,571.00 |
| **බැරකම්** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම පාරිතෝශිත බැඳීම් | 10 | 70,918,812.89 | 53,562,763.88 |
| විලම්භිත ආදායම් | 11 | 1,091,547,414.97 | 702,648,721.18 |
| රාජ්‍ය ප්‍රදාන ව්‍යාපෘති (2006 අයවැය යෝජනා) | | 54,040,042.00 | 54,040,042.00 |
| | | 1,216,506,269.86 | 810,251,527.06 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 12 | 45,340,944.08 | 35,584,124.16 |
| කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් | | 24,034,058.16 | 21,930,997.83 |
| | | 69,375,002.24 | 57,515,121.99 |
| **මුළු බැරකම්** | | 1,285,881,272.10 | 867,766,649.05 |
| **මුළු හිමිකම් හා බැරකම්** | | 1,271,913,374.73 | 886,606,220.06 |

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2015<br>රු | 2014<br>රු. |
|---|---|---|
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය*** | | |
| ශුද්ධ ලාභ / අලාභ | 11,443,032.45 | (26,327,841.81) |
| ගැලපීම් | | |
| ක්ෂය - ස්ථාවර වත්කම් | 35,609,628.64 | 33,768,364.43 |
| ක්ෂය - අභිජනන උපකාර | 25,526,354.92 | 24,571,238.26 |
| අඩමාන ණය | 1,554,649.14 | 1,057,742.08 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 18,698,933.01 | 14,422,874.81 |
| පෙර වර්ෂ ගැලපීම් | 4,238,561.82 | - |
| වත්කම් විකුණුම් මත ලාභ | (4,694,898.00) | (3,260,187.96) |
| විලම්භිත ණය | (61,135,983.56) | (58,339,602.69) |
| කාරක ප්‍රාග්ධන ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය | 31,240,278.42 | (14,107,412.88) |
| (වැඩිවීම්) / අඩුවීම් තොග | (4,507,264.83) | (9,202,275.95) |
| (වැඩිවීම්) / අඩුවීම් අත්තිකාරම් හා කලින් ගෙවීම් | (189,849.63) | 3,267.69 |
| (වැඩිවීම්) / අඩුවීම් ණය ගැති හා අනෙකුත් ලැබීම් | (28,992,209.04) | (2,023,278.14) |
| (අඩුවීම් ) / වැඩිවීම් කොන්ත්‍රාත් මත රඳවා ගත් ලැබීම් | 2,103,060.33 | 9,633,615.99 |
| අඩුවීම් ) / වැඩිවීම් වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 9,756,819.92 | 293,833.56 |
| මෙහෙයුම් කටයුතු වලින් උපයන ලද මුදල් | 9,410,835.17 | (15,402,249.73) |
| පාරිතෝෂිත ගෙවීම් | (1,342,884.00) | (2,091,771.75) |
| මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | **8,067,951.17** | **(17,494,021.48)** |
| ***ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය*** | | |
| දේපළ පිරියත හා මිලට ගැනුම් | (57,622,956.66) | (27,226,672.84) |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | (17,463,020.30) | (47,187,303.03) |
| ආයෝජන | - | - |
| දේපළ පරියත ඉවත් කිරීම් | 4,694,898.00 | 3,288,990.98 |
| ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය | **(70,391,078.96)** | **(71,124,984.89)** |
| ***මූල්‍ය කටයුතු මත මුදල් ප්‍රවාහය*** | | |
| ප්‍රාග්ධනය ප්‍රතිපාදන ලැබීම් (භාන්ඩාගාර) | 100,000,000.00 | 95,000,000.00 |
| ආදායම් බදු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය | 100,000,000.00 | 95,000,000.00 |
| මුදල් , මුදල් හා සමාන ලෛතමයන්ගෙන් වූ ශුද්ධ වැඩිවීම් / අඩුවීම් | 37,676,872.21 | 6,380,993.63 |
| වර්ෂ ආරම්භක මුදල් , මුදල් හා සමාන ලෛතමයන්ගේ වටිනාකම | 11,591,440.47 | 5,210,446.84 |
| වර්ෂ අවසාන මුදල් , මුදල් හා සමාන ලෛතමයන්ගේ වටිනාකම | 49,268,312.68 | 11,591,440.47 |
| ***මුදල්, මුදල් හා සමාන ලෛතමයන්ගේ විග්‍රහය*** | | |
| වර්ෂ අවසානයට | | |
| බැංකු ශේෂය | 49,268,312.68 | 11,591,440.47 |
| මුදල් ශේෂය ( අතැති මුදල්) | - | - |
| | 49,268,312.68 | 11,591,440.47 |
| බැංකු අයිරාව | - | - |
| | 49,268,312.68 | 11,591,440.47 |

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | රාජ්‍ය ප්‍රදානයන් | | වත්කම් ප්‍රත්‍යාගණන අරමුදල | රඳවා ගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | | | |
| 2014.01.01 දිනට ශේෂය | - | 139,230,329.73 | 17,400,000.00 | (179,236,244.07) | (22,605,914.34) |
| රාජ්‍ය ප්‍රදානයන් | 215,200,000.00 | 95,000,000.00 | - | - | 310,200,000.00 |
| විලම්භිත ආදායමට මාරු කිරීම් (2014 වර්ෂයට අදාලව) | - | (27,226,672.84) | 0.00 | - | (27,226,672.84) |
| ලාභාලාභ ගිණුමට මාරු කිරීම් | (215,200,000.00) | - | - | - | (215,200,000.00) |
| වර්ෂයේ ශුද්ධ ලාභ/අලාභ | - | - | - | (26,327,841.81) | (26,327,841.81) |
| **2014.12..31 දිනට ශේෂය** | **-** | **207,003,656.89** | **17,400,000.00** | **(205,564,085.89)** | **18,839,571.00** |
| | | | | | |
| 2015.01.01 දිනට ශේෂය | - | 207,003,656.89 | 17,400,000.00 | (205,564,085.89) | 18,839,571.00 |
| රාජ්‍ය ප්‍රදානයන් - පුනරාවර්ථන හා ප්‍රග්ධන | 313,090,250.00 | 100,000,000.00 | 0.00 | - | 413,090,250.00 |
| රාජ්‍ය ප්‍රදානයන් - ඉරණමඩු අභිජනන මධ්‍යස්ථානය ඉදිකිම | - | 280,780,717.39 | 0.00 | - | 280,780,717.39 |
| මුදලින් නොවන රාජ්‍ය ප්‍රදානයන් | - | 30,760,000.00 | 0.00 | - | 30,760,000.00 |
| විලම්භිත ආදායමට මාරු කිරීම් (2014 වර්ෂයට අදලව) | - | (460,029,780.04) | 0.00 | - | (460,029,780.04) |
| ලාභාලාභ ගිණුමට මාරු කිරීම් | (313,090,250.00) | - | - | - | (313,090,250.00) |
| පෙරවර්ෂ ගැලපුම් | 0.00 | - | - | 4,238,561.82 | 4,238,561.82 |
| වර්ෂයේ ශුද්ධ ලාභ/අලාභ | - | - | - | 11,443,032.45 | 11,443,032.45 |
| **2015.12..31 දිනට ශේෂය** | **-** | **158,514,594.24** | **17,400,000.00** | **(189,882,491.62)** | **(13,967,897.38)** |

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## ආදායම් ප්‍රකාශය

| | සටහන් | 2015<br>රු | 2014<br>රු |
|---|---|---|---|
| ආදායම | | 95,585,212.24 | 57,134,456 |
| මත්ස්‍ය අභිජනන ක්‍රියාවලියේ පිරිවැය | 13 | (83,002,781.06) | (60,305,736) |
| දළ අලාභය | | **12,582,431.18** | **(3,171,279)** |
| වෙනත් ආදායම | 14 | 51,941,769.97 | 43,320,266 |
| රාජ්‍ය ප්‍රදානයන් (පුනරාවර්ථන) | | 313,090,250.00 | 215,200,000 |
| | | **377,614,451.15** | **255,348,987** |
| ආයතනික හා පරිපාලන වියදම් | 15 | (389,847,289.79) | (297,409,554) |
| බෙදාහැරීමේ වියදම් | 16 | (47,361,304.63) | (42,539,557) |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 17 | (93,910.53) | (67,321) |
| | | **(437,302,504.95)** | **(340,016,432)** |
| විලම්භිත ආදායම් ගැලපීමට පෙර දළ අලාභය | | **(59,688,053.80)** | **(84,667,444)** |
| විලම්භිත ආදායම් | 10 | **71,131,086.25** | **58,339,603** |
| ශුද්ධ අලාභය | | **11,443,032.45** | **(26,327,842)** |

# ගිණුම්කරණ සටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 පොදු

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 1998 අංක 53 දරණ පනතින් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ස්ථාපිත කර ඇත. ප්‍රධාන කාර්යාලය අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා ව්‍යාපාර ස්වභාවය

අදාල වර්ෂයේදී ද ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ මත්ස්‍ය බීජ අලෙවිය වේ.

## 2 ඉදිරිපත් කිරීමේ පදනම

ගිණුම් වාර්තා ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන ඉදිරිපත් කර ඇත. වර්ෂය තුලදී වත්කම් තුල ප්‍රත්‍යාගනන අගයන් ගැලපීම් හා උද්ධමනකාරි සාදක සඳහා ගැලපීම් සිදුකර නැත.

### 2.1 ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම

අධිකාරියේ ගිණුම් වාර්තා පොදුවේ පිලිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අධිකාරිය ස්ථාපිත කල 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ අවශ්‍යතාවය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන මත සකස් කර ඇත.

### 2.2 සංසන්ධනාත්මක තොරතුරු

අධිකාරිය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව ආදේශ කර ඇති අතර පෙර වර්ෂවල භාවිතා කල ප්‍රතිපත්ති හා සැසඳේ.

## 3 ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය පිලිබඳ සාරාංශය

### 3.1 වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළඳ කටයුතු වලින් ලැබිය යුතු දෑ බොල් ණය හා අඩමාන ණය ගැලපීම් වලින් පසු ශුද්ධ වටිනාකම පෙන්නුම්කර ඇත. අනෙකුත් ලැබිය යුතු දෑ පිරිවැය මත හඳුනාගෙන ඇත.

### 3.2 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් සේ ඉදිරිපත් කර ඇත.

### 3.3 දේපල, පිරියත හා උපකරණ

ඉඩම් හැර අනෙකුත් වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ වටිනාකම පෙන්වා ඇත.වත්කමේ ජීවකාලය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ඇත. ක්ෂය ප්‍රතිශතයන් පහතින් දැක්වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 4% |
| වාහන | 20% |
| ලිබඩු සහ කාර්යාලීය | 10% |
| රසායනාගාර උපකරණ | 10% |
| යාන්ත්‍රික සහ අනෙකුත් උපකරණ | 10% |
| අභිජනනාගාර උපකරණ | 10% |
| මත්ස්‍ය තටාක | 10% |
| මත්ස්‍ය පොකුණු | 6% |
| උපකරණ සහ උපාංග | 10% |
| පරිගණක හා පණිඩවුඩ හුවමාරු උපකරණ | 20% |
| පරිගණක මෘදුකාංග | 10% |

සටහන

අධිකාරියේ හෙක්ටයාර 6.8799 ක ඉඩම් ස්ථාවර වත්කම් ලෙස ලබාගෙන නැත්තේ තක්සේරු කටයුතු සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට භාරදී ඇතත් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන ප්‍රත්‍යාගනන වාර්තා ලැබී නොමැති බැවිනි.

### 3.4 අඩමාන ණය

වර්ෂ අවසානයේ ඇති ණයගැති ශේෂයෙන් 10% ක් අඩමාන ණය ලෙස වෙන්කර ඇත.

### 3.5 තොග

තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට ගණනය කර ඇත.

### 3.6 විශ්‍රාම පාරිතෝෂිත

පාරිතෝෂිත බැඳීම් අර්ථ දැක්වීම

පාරිතෝෂිත ගණනය කර ඇත්තේ සේවයට බැඳුනු දින සිට වර්ෂයට මාස 1/2 දල වැටුප බැගිනි. නමුත් 1983 අංක 12 දරණ පාරිතෝෂිත පනත අනුකූලව අධිකාරියේ වසර 5 ක් අඛණ්ඩව සේවයේ නියුක්ත නිලධාරීන් පමණක් පාරිතෝෂිත ලබා ගැනීම සඳහා නීතියානුකූලව බැඳේ.

දායකත්ව සැලසුම අර්ථ දැක්වීම-සේවක අර්ධ සාධක හා සේවක භාරකාර අරමුදල

සේවකයන් සේවක අර්ධ සාදක අරමුදලට දායකවීම අනිවාර්ය අතර සේවක භාරකාර අරමුදල අදාල රෙගුලාසි අනුව සිදුකෙරේ. අධිකාරිය සේවක අර්ධ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දල ඉපැයීම්වලින් 15% ක හා 3% ක දායකත්වය දරනු ලබයි.

### 3.7 ආදායම් හඳුනා ගැනීම

ලැබිය යුතු හා ලද ආදයම සාධාරණ අගය මත සලකා ආදායම් ලෙෂ ගණනය කර ඇත.

### 3.8 වියදම් හඳුනා ගැනීම

ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස හඳුනාගෙන ඇත්තේ එක් එක් ආදායම් ඉපැයීම් සඳහා දරා ඇති වියදම්වේ. සියලුම නිශ්පාදන ක්‍රියාවලිය සඳහා දරන ලද වියදම් හා දේපල ,පිරියත හා උපකරණ කාර්යක්ෂම භාවිතය සඳහා නඩත්තු කිරීම් ආදායමට අයකිරිම තුලින් වර්ෂයට අදාල ලාභ/අලාභ අගය පැමිණ ඇත.

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

2015 දෙසැම්බර් මස 31 දිනට ස්ථාවර වත්කම්

**සටහන 4**

**දේපල පිරියත හා උපකරණ**

| පිරිවැය | 2015.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ එකතු කිරීම් | වර්ෂය තුළ ඉවත් කිරීම් | 2015.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් | 146,411,854.00 | - | - | 146,411,854.00 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 381,773,586.07 | 181,933,712.98 | - | 563,707,299.05 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (ADB) | 206,460,717.00 | - | - | 206,460,717.00 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (නව ගොඩනැගිල්ල ) | 3,184,404.00 | - | - | 3,184,404.00 |
| ලීබඩු සහ කාර්යාලීය | 32,654,981.22 | 7,359,124.95 | - | 40,014,106.17 |
| ලීබඩු සහ කාර්යාලීය (ADB) | 4,911,820.00 | - | - | 4,911,820.00 |
| රසායනාගාර උපකරණ | 10,137,482.80 | 3,536,535.90 | - | 13,674,018.70 |
| යාන්ත්‍රික සහ අනෙකුත් උපකරණ | 22,518,850.66 | 4,017,603.00 | - | 26,536,453.66 |
| පරිභෝජන ද්‍රව්‍ය සහ විවිධ උපකරණ | 10,137,648.96 | - | - | 10,137,648.96 |
| උපකරණ සහ උපාංග | 1,573,467.00 | - | - | 1,573,467.00 |
| වාහන | 56,628,401.91 | 30,919,741.95 | 3,287,300.00 | 84,260,843.86 |
| වාහන (ADB) | 38,833,274.00 | - | 639,370.00 | 38,193,904.00 |
| පරිගණක හා පණිවුඩ හුවමාරු උපකරණ | 8,755,954.99 | 2,118,700.00 | - | 10,874,654.99 |
| පරිගණක මෘදුකාංග | 1,155,625.00 | - | - | 1,155,625.00 |
| | **925,138,067.61** | **229,885,418.78** | **3,926,670.00** | **1,151,096,816.39** |
| **ක්ෂය** | **2015.01.01 දිනට ශේෂය** | **වර්ෂය තුළ එකතු කිරීම්** | **වර්ෂය තුළ ඉවත් කිරීම්** | **2015.12.31 දිනට ශේෂය** |
| ඉඩම් | - | | - | 0.00 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 105,005,753.67 | 15,270,943.45 | - | 120,276,697.12 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (ADB) | 49,550,572.08 | 8,258,428.68 | - | 57,809,000.76 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (නව ගොඩනැගිල්ල ) | 3,184,404.00 | - | - | 3,184,404.00 |
| ලීබඩු සහ කාර්යාලීය | 18,982,859.60 | 2,415,814.61 | - | 21,398,674.21 |
| ලීබඩු සහ කාර්යාලීය (ADB) | 2,947,092.00 | 491,182.00 | - | 3,438,274.00 |
| රසායනාගාර උපකරණ | 6,864,963.32 | 577,826.45 | - | 7,442,789.77 |
| යාන්ත්‍රික සහ අනෙකුත් උපකරණ | 14,808,057.72 | 1,346,753.40 | - | 16,154,811.12 |
| පරිභෝජන ද්‍රව්‍ය සහ විවිධ උපකරණ | 7,344,422.14 | 860,934.62 | - | 8,205,356.76 |
| උපකරණ සහ උපාංග | 1,573,001.29 | 466.00 | - | 1,573,467.29 |
| වාහන | 39,462,692.93 | 6,350,871.36 | 3,287,300.00 | 42,526,264.29 |
| වාහන (ADB) | 38,833,274.00 | - | 639,370.00 | 38,193,904.00 |
| පරිගණක හා පණිවුඩ හුවමාරු උපකරණ | 5,388,996.46 | 1,271,761.47 | - | 6,660,757.93 |
| පරිගණක මෘදුකාංග | 342,348.22 | 111,400.00 | - | 453,748.22 |
| | **294,288,437.42** | **36,956,382.04** | **3,926,670.00** | **327,318,149.46** |
| ලියාහළු අගය | **630,849,630.19** | | | **823,778,666.93** |

**සටහන 5**

**අභිජනන ක්‍රියාවලියට අදාල වත්කම්**

| පිරිවැය | 2015.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ එකතු කිරීම් | වර්ෂය තුළ ඉවත් කිරීම් | 2015.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| අභිජනනාගාර උපකරණ | 12,283,745.87 | 3,775,712.56 | - | 16,059,458.43 |
| අභිජනනාගාර උපකරණ (ADB) | 84,246,743.00 | - | - | 84,246,743.00 |
| මත්ස්‍ය තටාක | 28,781,971.19 | 11,829,342.29 | - | 40,611,313.48 |
| මත්ස්‍ය පොකුණු | 225,993,310.20 | 160,865,400.76 | - | 386,858,710.96 |
| | **351,305,770.26** | **176,470,455.61** | **-** | **527,776,225.87** |
| **ක්ෂය** | **2015.01.01 දිනට ශේෂය** | **වර්ෂය තුළ එකතු කිරීම්** | **වර්ෂය තුළ ඉවත් කිරීම්** | **2015.12.31 දිනට ශේෂය** |
| අභිජනනාගාර උපකරණ | 6,186,364.95 | 799,029.09 | - | 6,985,394.04 |
| අභිජනනාගාර උපකරණ (ADB) | 33,698,697.20 | 8,424,674.30 | - | 42,123,371.50 |
| මත්ස්‍ය තටාක | 8,477,342.80 | 2,708,851.52 | - | 11,186,194.32 |
| මත්ස්‍ය පොකුණු | 169,869,260.38 | 12,247,046.61 | - | 182,116,306.99 |
| | **218,231,665.33** | **24,179,601.52** | **-** | **242,411,266.85** |
| ලියාහළු අගය | **133,074,104.93** | | | **285,364,959.02** |

# විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව .

මගේ අංකය / எனது இல. / My No. } එෆ්එල්එස්/ඒ/එන්ඒකිව්ඩීඒ/1/15/08 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 නොවැම්බර් 30දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය(සංශෝධන) පනතින් සංශෝධිත 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ 25 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

42

1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03

ගණුදෙනුවක්, වෙනත් සිදුවීමක් හෝ තත්ත්වයක් කෙරෙහි ව්‍යවහාර වන නිශ්චිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියක් නොමැති විට කළමනාකරණය විසින් උචිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර එය අනුගමනය කළ යුතු වුවද, අධිකාරිය විසින් 2009 වර්ෂයේදී රු. 91,700 කට මිලදීගෙන තිබූ ජීව විද්‍යාත්මක වත්කම් වලට අදාළ කිරිදෙනුන් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද රාජ්‍ය ප්‍රදාන සම්බන්ධයෙන් එලෙස නිර්මාණය කර අනුගමනය කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

දේපළ, පිරියත හා උපකරණ වල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වනවිට වාර්ෂික ප්‍රත්‍යාගණනයන් සිදුකිරීම සහ ප්‍රමාණාත්මක නොවන වෙනස්කම් සහිත දේපල පිරියත හා උපකරණ සඳහා නිතර සිදුකරන ප්‍රත්‍යාගණනයන් අවශ්‍ය නොවුවද වසර 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය සිදුකිරීම ප්‍රමාණවත් වුවත්, අධිකාරිය 2012 වර්ෂයෙන් පසුව වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු සිදුකර නොතිබුණි.

50

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මත්ස්‍ය බීජ තොගය රු.131,907 කින් වැඩියෙන් ආගණනය කිරීම හේතුවෙන් අවසාන තොග වටිනාකම හා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ දෙක හා සමාලෝචිත වර්ෂය තුළ සෘජු බැංකු බැර රු.2,865,680 ක් හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව උපචිත වියදම් ශේෂය අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.412,560 ක වෙනසක් විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

ජර්නල් අංක 57 මගින් කරනු ලැබූ ගැලපීම් රු.6,644,148 ක් සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මත්ස්‍ය පැටවුන් විකිණීමෙන් ලැබිය යුතු රු.12,772,747 ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 05 ඉක්මවූ ශේෂය රු.1,543,928 ක් හා වර්ෂ 03 ඉක්මවූ ශේෂය රු.1,749,745 ක්වූ අතර මෙම ණය අයකරගැනීමේ කටයුතු මන්දගාමීව පැවතිණි.

(ආ) වසර 05 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් රු.363,329 ක් වූ රඳවා ගැනීමේ බදු ශේෂය (WHT) නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වසර තුනකට වැඩි කාලයක සිට පැවත එන රු.78,892 ක් වූ අවලංගු චෙක්පත් 03 ක්, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) | 2014 ඔක්තෝබර් මස 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.6 ඡේදය හා 4 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඊට අදාළ වාර්තා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට පිටපත් සහිතව විගණකාධිපති වෙත යොමුකර ඒ බව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ වෙත දැනුම් දීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | 2001 වර්ෂයේ සිට පැවත එන, කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම් කිරීමේදී රඳවාගෙන තිබූ එකතුව රු.8,711,679 ක රඳවා ගැනීම් මුදල් රාජ්‍ය ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

2009 වර්ෂයේ දී බාහිර පුද්ගලයන් හා ආයතන වලට මත්ස්‍ය බීජ සැපයීම වෙනුවෙන් අයවිය යුතුව තිබූ රු.1,207,278 ක ශේෂයක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කපාහැර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,443,032 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.26,327,842 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.37,770,874 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. පරිපාලන වියදම් රු.92,437,735 කින් වැඩිවුවද දළ ලාභය, රාජ්‍ය ප්‍රදානයන් හා විලම්භිත ආදායම් පිළිවෙලින් රු.15,753,710 ක්, රු.97,890,250 ක් හා රු.12,791,483 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.25,754,103 ක්ව පැවති අධිකාරියේ ඌනතාවය 2013 වර්ෂය වනවිට රු.9,099,309 ක් දක්වා අඩු වුවද 2014 වර්ෂය වනවිට නැවත රු.26,327,842 ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද 2015 වර්ෂයේදී එය රු.11,443,032 ක අතිරික්තයක් වී තිබුණි. කෙසේ වුවද ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා සේවක පාරිශ්‍රමික සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.178,006,091 ක්ව පැවති අධිකාරියේ දායකත්වය ක්‍රමිකව වර්ධනය වී 2015 වර්ෂය අවසානයට රු.372,125,864 ක් වී තිබුණි.

3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර ආයතනයක් විසින් බදු මුදල් නොගෙවීම මත මිරිදිය ධීවර මධ්‍යස්ථානය නැවත පවරාගැනීමට එරෙහිව සහ සේවකයෙකු විසින් නැවත රැකියාව ලබාගැනීම හා බාහිර පාර්ශවයක් විසින් වාහන අනතුරක් සම්බන්ධයෙන් සහ එකතුව රු.105,316,000 ක වන්දි ඉල්ලා, ආයතනයට විරුද්ධව නඩු 03ක් ගොනු කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කාර්යසාධනය

-----------------

2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය(සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව එහි කර්තව්‍යයන් පහත පරිදි වේ.

- රට තුළ මත්ස්‍ය නිෂ්පාදනය සහ පරිභෝජනය වැඩිකිරීමේ අරමුණින්, මිරිදිය, කිවුල්දිය, වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගාව වැඩි දියුණු කිරීම හා එමගින් රැකියා අවස්ථා ඇතිකර ගැනීම හා ප්‍රවර්ධනය කිරීම

- අපනයනය සඳහා විසිතුරු මත්ස්‍ය විශේෂ ඇතුලුව වැඩි වටිනාකමක් ඇති මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම සහ ජලජීවී වගාව සඳහා පෞද්ගලික අංශයේ සුළු , මධ්‍යම හා මහා පරිමාණ ආයෝජන ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම සහ වැඩිදියුණු කිරීම.

- ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි, ජලජීවී වගාව සහ ජලජීවී වගා මෙහෙයුම් සඳහා යොදාගනු ලබන ජලජ සම්පත් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම, සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ සැලසුම් හා පරිසර හිතකාමී වගා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.

- ජලජ සම්පත් ආනයනකරුවකු, අපනයනකරුවකු, අලෙවිකරුවකු, සපයන්නකු හා බෙදාහරින්නකු ලෙස ව්‍යාපාරය කරගෙනයාම සහ එම කාර්යයන්හි යෙදී සිටින තැනැත්තන්ට සහාය වීම යනාදිය වේ.

සමාලෝචිත වර්ෂය තුලදී ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ප්‍රධාන කර්තව්‍යක් වූ ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි, ජලජීවී වගාව සහ ජලජීවී වගා මෙහෙයුම් සඳහා යොදාගනු ලබන ජලජ සම්පත් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම, සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ සැලසුම් හා පරිසර හිතකාමී වගා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම සිදුකර නොතිබුණි.

(ආ) අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඉහත කර්තව්‍යවයන් වෙන් වෙන්ව ගෙන සැලසුම් කරනු වෙනුවට ප්‍රධාන මාතෘකා හතරක් යටතේ ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ කාර්යයසාධන වාර්තාවට අනුව ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වූ ක්‍රියාකාරකම් ඉටුකිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මිරිදිය ජලජීවී වගා සංවර්ධනය සඳහා ප්‍රදර්ශන හා අධ්‍යාපනික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.100,000 ක් වෙන්කර තිබූ නමුත් ඉන් රු.90,000 ක් ඉතිරිවී තිබුණි. තවද පුහුණු වැඩසටහන් සඳහා ඉලක්කගත නිලධාරීන් සහ වැඩසටහන් සංඛ්‍යාව සැලසුම් කර නොතිබුණි.

(ii) මසුන් බෝකරන ස්ථාන සංවර්ධනය සඳහා රු.4,500,000 ක් වෙන්කර තිබුණද ඉන් රු.2,460,000 ක් හෙවත් සියයට 55 කට අදාළ ඉදිකිරීම් පමණක් සිදුකර තිබුණි.

(iii) උඩවලව (තිලාපියා) ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ජල මූල ආශ්‍රිත අභිජනනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා රු.2,000,000 ක් වෙන්කර තිබුණද රු.1,250,000 ක් පමණක් වැයකර තිබුණු අතර, මේ අනුව ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 62.5 ක් විය.

(iv) රම්බඩගල්ල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ විද්‍යාගාරය ඒ ආශ්‍රිත ආකෘතිය ඉදිකිරීම් සඳහා රු.250,000 ක් වෙන්කර තිබුණද ඉන් රු.140,000 ක් පමණක් වැයකර තිබූ බැවින් මූල්‍ය කාර්යසාධනයේ ප්‍රගතිය සියයට 56 ක් විය.

(v) මඩකලපුව ඉස්සන් වගා පසුවිපරම් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.4,000,000 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂයේ රු.1,520,000 ක කාර්යයන් පමණක් ඉටුකර තිබුණි.ඒ අනුව සියයට 62 ක කාර්යයන් ඉටුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වසර ගණනාවක සිට මාළු ඇසිත්තන් ඇල්ලීමේ කටයුතු සඳහා සුදුසු හා යෝග්‍ය තත්ත්වයේ දැල් ලබාගැනීමට නොහැකි වී ඇති බවත්, එම නිසා මධ්‍යස්ථාන තුළ මත්ස්‍ය බීජ නිෂ්පාදන කටයුතු වලට බාධා වී ඇති බවත් අධිකාරියේ සභාපති විසින් ලිඛිතව තහවුරු කර තිබුණ ද, ඒ සඳහා විසඳුමක් සොයා ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ආ) අනුරාධපුර දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාපෘති කාර්යාලයට අදාළව අවස්ථා ගණනාවකදී අභ්‍යන්තර විගණන අංශය විසින් කරනු ලැබූ පරීක්ෂණයන්හි දී හඳුනාගෙන තිබූ වටිනාකම රු.1,068,380 ක් වූ අක්‍රමිකතාවයන් හා වගා ව්‍යාප්ති නිලධාරීන් ක්ෂේත්‍ර හා අනෙකුත් සම්බන්ධිත රාජකාරි කටයුතු වල නිරත නොවීම සම්බන්ධයෙන් කළමණාකරණය විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 4.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී විසිතුරු මත්ස්‍ය වගාව සඳහා මසුන් ආනයනය කිරීමට වෙන්කල රු.2,000,000 ක මුදල ඒ සඳහා උපයෝජනය කර නොතිබූ අතර එයින් රු.183,082 ක් පමණක් දේශීය මව් මසුන් මිලදී ගැනීම සහ පටක රෝපණ විද්‍යාගාරයට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා වැය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ කිලිනොච්චියේ ඉරණමඩු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානයෙන් අරමුණුගත කාර්යයන්ට වැය නොකර රු.8,903,800 ක් හෝර්මෝන, රසායන ද්‍රව්‍ය හා ඔක්සිජන් වැනි පරිභෝජන ද්‍රව්‍ය මිලදීගැනීම සඳහා ද, රු.1,091,302 ක් ජලජීවී වගා සංවර්ධන කටයුතු සඳහාද වැයකර තිබුණු අතර, එම මිලදී ගන්නා ලද පරිභෝජන ද්‍රව්‍යද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම උපයෝජනය කර නොතිබුණි.

### 4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපල වල ව්‍යාපෘති ආරම්භ කිරීම.

අධිකාරියට අයත් නොවන හෙක්ටයාර 38.7526 ක ඉඩම් අධිකාරිය වෙත පවරා ගැනීමකින් තොරව සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත ඉංජිනේරු තනතුරු දෙකෙන් එක් තනතුරක් 2008 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතීම නිසා මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 11 ක ඉදිකිරීම, ප්‍රතිසංස්කරණ කටයුතු සහ රැඳවුම් මුදල් නිදහස් කිරීම ආදී කාර්යයන් ඉටු කිරීමේදී ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය.

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

35

(ආ) ආයතනය ස්ථාපිත කල 1999 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ තනතුර හා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 04 අධිකාරිය විසින් 2016 ජුනි මාසය වන විටත් පිරවීමට කටයුතු කර නොතිබුණි. මෙම තනතුරු 05 ට අදාල රාජකාරි හා කාර්ය භාරයන් ලිඛිත පැවරීමකින් තොරව පහළ මට්ටමේ නිලධාරීන් මගින් ආවරණය කිරීමට විධිවිධාන යොදා තිබුණි.

(ඇ) අධිකාරියේ අධ්‍යක්ෂ මුදල් තනතුර සඳහා වාර්ෂිකව දීර්ඝ කිරීමේ කොන්ත්‍රාත් පදනම මත 2014 මැයි 06 දින සිට නිලධාරිනියක පත්කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් ස්ථිර පත්කිරීම් සිදුකිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන් 43 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් දිස්ත්‍රික් කාර්යාල 20 ක් තුළ ව්‍යාප්තවී ඇති නීති විරෝධී මත්ස්‍ය ක්‍රියාකාරකම් වැටලීම ඒ තුළින් අධිකාරියට දඩ මුදල් උපයා ගැනීම, මත්ස්‍ය ප්‍රවර්ධන ව්‍යාප්ත කිරීම හා මත්ස්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත එකතු කිරීම ආදී රාජකාරි කටයුතු ප්‍රශස්ථ මට්ටමින් සිදු කිරීමට බාධාවක් වී තිබුණි.

(ඉ) කළමනාකරණය විසින් ආයතනයේ අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව සේවක බඳවාගැනීම් අනුමත කර ගැනීම නිසා කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) තනතුරු සඳහා කම්කරුවන් 4 දෙනෙකු යෙදවීමට සිදුවී තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් වූ සැලසුම් ප්‍රධාන ක්‍රියාකාරී සැලැස්මෙන් බැහැරව වෙන් වෙන්ව සකසා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ඉලක්කගත දත්තයන් දක්වා නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩලය තිදෙනෙකුට සීමා වීමෙන් අධිකාරියේ කටයුතු පිළිබඳ ප්‍රමාණවත් ක්ෂේත්‍රයක් අභ්‍යන්තර විගණනය මගින් ආවරණය කොට නොතිබුණි.

(ආ) විශේෂ ව්‍යාපෘති විගණනයට අදාළ විගණන සැලැස්ම වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහනට අන්තර්ග්‍රහණය කර නොතිබීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි.

(ඇ) 2010 ජූලි 26 දිනැති අංක 1 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව, ඵලදායිව සහ අරපිරිමැස්මෙන් භාවිතා කර සංවර්ධන ව්‍යාපෘතීන් කලට වෙලාවට ඵලදායී ලෙස අවසන් කිරීම සඳහා වූ ගණන්දීමේ නිලධාරියා වෙත පැවරෙන වගකීම නිසි අයුරින් ඉටුකිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් ව්‍යාපෘති ලේඛන නඩත්තු කිරීමක් හා චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීමක් කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 12 සිට සියයට 370 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

2014 නොවැම්බර් 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී කරනු ලැබූ පහත නියෝග සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉටුකර නොතිබුණි.

(අ) අධ්‍යක්ෂ මානව සම්පත් තනතුර, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 03 ක් ,සංචාරක බංගලා භාරකරු තනතුර, භාෂා පරිවර්තක, ජලජීවී අර්ථ ශාස්ත්‍රඥ හා සිවිල් ඉංජිනේරු ඇතුළුව මාණ්ඩලික පුරප්පාඩු 10 ක් පිරවීමට කටයුතු කිරීම.

(ආ) පොළොන්නරුව ජලජීවී වගා මධ්‍යස්ථානය බදුදී තිබුණු පෞද්ගලික සමාගම විසින් වන්දි ඉල්ලා පවරා තිබූ නඩුව සම්බන්ධයෙන් බේරුම්කරණයට යෑම.

(ඇ) 2006 වර්ෂයේදී මත්ස්‍ය බීජ ඒකක 25 ක් ඉදිකිරීම සඳහා වැයකල රු.11,094,329 ක මුදල් අයකර ගැනීම පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබීම.

(ඈ) අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව ජනාධිපති ලේකම් කාර්යාලය වෙත නිදහස් කරන ලද නිලධාරිණියක වෙත 2009 නොවැම්බර් 19 දින සිට 2015 මැයි 31 දින දක්වා ගෙවා තිබූ වැටුප් රු. 755,973 ක් ප්‍රතිපූරණය කර ගැනීම.

AGDSL
Auditor General's Department

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමුවිය යුතුව ඇත.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) කොන්ත්‍රාත් පරිපාලනය | - අධි ඇස්තමේන්තු සැකසීම.<br>- ඉදිකිරීම් වලට අදාළ සැලසුම්වල කාල රාමු සහ සැලසුම්වල කාලීන වෙනස්කම් ඉදිරිපත් නොකිරීම. |
| (ආ) අත්තිකාරම් පාලනය හා ලේඛන පවත්වාගෙන යාම | - අත්තිකාරම් පියවීමට අදාළ වවුචර් අංක ලේඛනයෙහි ඇතුළත් නොකිරීම.<br>- අත්තිකාරම් අදාල කාර්යය නිමකල විගසම නිරවුල් කිරීමට කටයුතු නොකිරීම.<br>- අත්තිකාරම් ලබා ගන්නා නිලධාරීන්ගේ තනතුරු නාම අත්තිකාරම් ලේඛනයෙහි සඳහන් නොකිරීම. |

එච්.එම්.ගාමිණි විජේසිංහ

විගණකාධිපති

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

| දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා | 2015 | 2014 |
|---|---|---|
| | රු | රු |
| **සටහන - 10** | | |
| **විශ්‍රාමලාභී ප්‍රතිලාභ වගකීම්** | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 53,562,763.88 | 41,231,660.82 |
| වර්ෂයේ අයකිරීම | 18,698,933.01 | 14,422,874.81 |
| වර්ෂය තුල කල ගෙවීම් | (1,342,884.00) | (2,091,771.75) |
| වර්ෂයේ අවසාන ශේෂය | 70,918,812.89 | 53,562,763.88 |
| **සටහන - 11** | | |
| **විලම්භිත ආදායම** | | |
| **භාණ්ඩාගාරය හා අමාත්‍යාංශ ප්‍රතිපාදන - ප්‍රාග්ධන** | | |
| ශේෂය B/F අමාත්‍යාංශය | 492,896,802.22 | 507,164,447.83 |
| අවුරුද්ද තුල ලද ප්‍රධානයන් | 460,029,780.04 | 27,226,672.84 |
| ලාභ අලාභ ගිණුම | (54,447,983.27) | (41,494,318.45) |
| | 898,478,598.99 | 492,896,802.22 |
| **ආසියානු සංවර්ධන බැංකු ප්‍රධානයන්** | | |
| ශේෂය B/F | 209,751,918.96 | 226,597,203.20 |
| ලාභ අලාභ ගිණුම | (16,683,102.98) | (16,845,284.24) |
| | 193,068,815.98 | 209,751,918.96 |
| **සටහන - 12** | | |
| **වෙළඳාම හා අනෙකුත් ගෙවීම්** | | |
| **අනෙකුත් ණය හිමියෝ** | | |
| විවිධ තැන්පතු - මත්ස්‍ය ආහාර | - | 4,160,946.00 |
| ජලජීවී සංවර්ධිත අරමුදල | - | 2,469,816.74 |
| විවිධ තැන්පතු - අනෙකුත් | 1,725,796.27 | 5,525,503.77 |
| විවිධ තැන්පතු - (පලාත් සභා) | 1,968,790.32 | 325,833.32 |
| විවිධ තැන්පතු - (IUCN) | 71,212.00 | 71,212.00 |
| අන්තර් බැංකු හුවමාරු ගිණුම | 200,000.00 | 700,000.00 |
| කළමනාකරණ බලපත්‍රය | 217,938.01 | 217,938.01 |
| ධීවර හැඳුනුම්පත් | 301,907.90 | 447,975.47 |
| අවලංගු චෙක්පත් | 148,903.55 | 78,892.50 |
| ආරක්ෂිත තැන්පතු (Bonds) | 723,800.00 | 533,350.00 |
| ඇහිල්ලන් තොග FAO ව්‍යාපෘතිය | 593,704.00 | 593,704.00 |
| JICA | 121,732.85 | 121,732.85 |
| වියට්නාම් MOU | 454,948.60 | 604,948.60 |
| FAO - පරිපාලන වියදම් | 120.00 | 120.00 |
| දිවි නැගුම - කොන්දේසි | 21,939,602.16 | 10,217,562.71 |
| දිවි නැගුම - මසුන් තැන්පත් කිරීම | 1,258,960.75 | 1,258,960.75 |
| MH මඩ පොකුණු | - | 1,664,460.00 |
| යතුරු පැදි තැන්පතු අරමුදල | 246,867.61 | 566,686.26 |
| Brakish water Development | 509,358.00 | - |
| EU-SDDP-FAO Project | 657,727.62 | - |
| | 31,141,369.64 | 29,559,642.98 |
| **අනෙකුත් ගෙවීම්** | | |
| උපචිත වියදම් | 13,507,090.22 | 4,971,231.96 |
| විගණන ගාස්තු වෙන් කිරීම | 296,370.00 | 625,960.00 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 32,785.15 | 63,960.15 |
| උපයන විට ගෙවීම් (WHT) | 363,329.07 | 363,329.07 |
| | 14,199,574.44 | 6,024,481.18 |
| | 45,340,944.08 | 35,584,124.16 |

| දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා | | 2015 | 2014 |
|---|---|---|---|
| | | රු | රු |
| **සටහන - 13** | | | |
| **මත්ස්‍ය බීජ නිෂ්පාදන වියදම** | | | |
| ***තොගය 01.01*** | | | |
| මත්ස්‍ය බීජ | | 9,561,507.00 | 2,894,511.50 |
| මව් මත්ස්‍ය තොග | | 3,455,785.00 | 2,232,642.00 |
| එකතු කිරීම: මිලට ගැනීම / නිෂ්පාදන | | - | - |
| | | 13,017,292.00 | 5,127,153.50 |
| ***එකතු කලා: සෘජු වියදම්*** | | | |
| මව් මත්ස්‍ය කළමනාකරණ වියදම | | 3,603,031.95 | 3,083,017.78 |
| ***මත්ස්‍ය ආහාර පාරිභෝජනය*** | | | |
| ආරම්භක තොග 1.1 | 4,194,412.00 | | 4,584,212.00 |
| එකතු කිරීම: මිලට ගැනීම | 27,009,693.26 | | 16,407,326.71 |
| අඩු කිරීම: අවසන් තොග 31.12 | (4,213,920.80) | 26,990,184.46 | (4,194,412.00) |
| ***හෝර්මෝන, රසායන ද්‍රව්‍ය පරිභෝජනය*** | | | |
| ආරම්භක තොග 1.1 | 5,199,753.16 | | 3,820,371.92 |
| එකතු කිරීම: මිලට ගැනීම | 16,106,558.68 | | 7,991,545.83 |
| අඩු කිරීම: අවසන් තොග 31.12 | (15,377,662.40) | 5,928,649.44 | (5,199,753.16) |
| ***එකතු කලා: පොදු කාර්ය පිරිවැය (අභිජනන)*** | | | |
| විදුලිය හා ජලය (60%) | 8,877,625.22 | | 8,993,412.35 |
| ආරක්ෂක සේවය (50%) | 5,320,672.55 | | 6,470,704.90 |
| අළුත්වැඩියා හා නඩත්තු කිරීම - යන්ත්‍ර සූත්‍ර උපකර | 1,317,423.12 | | 1,668,209.48 |
| ක්ෂය :( Depreciation) Note (05) | 25,526,354.92 | 41,042,075.81 | 24,571,238.26 |
| ***අඩු කලා: අවසන් තොග 31.12*** | | | |
| මත්ස්‍ය බීජ | | (3,864,130.60) | (9,561,507.00) |
| මව් මත්ස්‍ය තොග | | (3,714,322.00) | (3,455,785.00) |
| මත්ස්‍ය බීජ නිෂ්පාදන සඳහා වියදම | | 83,002,781.06 | 60,305,735.58 |
| | | | |
| **සටහන - 14** | | | |
| ***අනෙකුත් ආදායම්*** | | | |
| බදු කුලිය | | 337,500.00 | 575,000.00 |
| සංචාරක බංගලාවේ ආදායම | | 1,024,896.40 | 949,472.00 |
| වෙනත් ආදායම් | | 2,870,060.12 | 1,746,728.14 |
| ගෙවල් කුලිය - නිල නිවාස | | 467,433.45 | 306,125.67 |
| ටෙන්ඩර් තැන්පතු - ආපසු නොගෙවන | | 398,400.00 | 553,100.00 |
| ආපදා ණය පොලිය | | 1,036,401.63 | 744,605.94 |
| යතුරු පැදි ණය පොලිය | | 23,619.06 | 5,541.87 |
| විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩසටහන | | 2,282,209.75 | 2,954,216.50 |
| ජලජීවී වගා බලපත්‍ර | | 3,611,715.00 | 4,160,780.00 |
| වත්කම් විකිණීමේ ගිණුම | | 4,694,898.00 | 3,260,187.96 |
| කලාවැව වැඩමුළු ආදායම | | 20,285,171.56 | 14,817,451.49 |
| ADB මිනි හැචරි ණය අයකරගැනීම | | - | 396,625.32 |
| මත්ස්‍ය පැටවුන් ප්‍රවාහනය කිරීමේ ආදායම | | 5,644,516.00 | 4,607,143.00 |
| දඩ මුදල් | | 499,167.00 | 689,833.50 |
| රාජ්‍ය හා පෞද්ගලික හවුල් පුද්ගල ආදායම | | 1,492,967.00 | 2,296,615.10 |
| විද්‍යාගාර පරීක්ෂණ ආදායම | | 6,069,275.00 | 4,323,840.00 |
| ක්ෂේත්‍ර පරීක්ෂණ ආදායම | | 1,146,000.00 | 933,000.00 |
| ධීවර හැඳුනුම්පත් | | 57,540.00 | - |
| | | 51,941,769.97 | 43,320,266.49 |

| දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා | 2015 | 2014 |
|---|---|---|
| | රු | රු |
| **සටහන - 15** | | |
| **පරිපාලන වියදම්** | | |
| *වැටුප් සහ දීමනා* | | |
| වැටුප් සහ අනෙකුත් දීමනා | 227,488,877.15 | 158,788,494.05 |
| අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | 9,806,835.52 | 8,264,987.94 |
| සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායකත්වය | 33,862,429.26 | 29,945,575.70 |
| සේවක භාරකාර මුදල් දායකත්වය | 6,973,603.17 | 7,445,882.69 |
| නිල ඇඳුම් | 194,708.88 | 31,200.00 |
| සුභසාධන වියදම් | 2,521,462.08 | 1,867,714.88 |
| පාරිතෝෂික වියදම් | 18,698,933.01 | 14,422,874.81 |
| | 299,546,849.07 | 220,766,730.07 |
| *සන්නිවේදනය* | | |
| දුරකථන ටෙලෙක්ස් සහ ෆැක්ස් අයකිරීම් | 3,052,262.55 | 2,935,400.18 |
| තැපැල් ගාස්තු සහ විදුලි පණිවුඩ | 959,468.00 | 442,060.00 |
| | 4,011,730.55 | 3,377,460.18 |
| *අලුත් වැඩියා සහ නඩත්තු* | | |
| කාර්යාල සහ මධ්‍යස්ථාන නඩත්තුව | 3,495,414.54 | 1,761,124.45 |
| උපකරණ නඩත්තුව | 3,400,596.32 | 1,707,771.94 |
| ක්ෂය වන ස්ථාවර වත්කම් | 29,258,757.28 | 28,080,964.71 |
| | 36,154,768.14 | 31,549,861.10 |
| **පරිශ්‍රය නඩත්තුව** | | |
| කුලිය | 1,708,140.29 | 732,054.00 |
| ගාස්තුව | 74,633.00 | 54,848.18 |
| පිරිසිදු කිරීමේ ගාස්තුව | 2,380,707.66 | 2,382,797.40 |
| ජල විදුලි ගාස්තු | 5,918,416.82 | 5,995,608.24 |
| | 10,081,897.77 | 9,165,307.82 |
| **වෙනත්** | | |
| විගණන ගාස්තු | 264,350.00 | - |
| ආරක්ෂක සේවය | 5,320,672.55 | 6,470,704.90 |
| දැන්වීම් ගාස්තු | 1,672,108.00 | 522,579.68 |
| පුවත් පත් වාර සඟරා හා අනෙකුත් ගාස්තු | 54,010.00 | 56,030.00 |
| ප්‍රවාහන ගාස්තු | 76,697.50 | 16,905.00 |
| ලිපි ද්‍රව්‍ය ගාස්තු | 2,591,530.50 | 845,448.63 |
| මුද්‍රණ කටයුතු | 297,194.72 | 1,062,017.25 |
| ගමන් ගාස්තු (දේශිය) | 5,222,052.60 | 4,973,631.72 |
| විවිධ වියදම් - වෙනත් | 906,781.18 | 579,220.56 |
| අධ්‍යක්ෂක මණ්ඩල ගෙවීම් | 344,575.00 | 551,458.00 |
| විද්‍යාගාර පාරිභෝගික උපකරණ (consumables) | 122,787.00 | 728,595.77 |
| යාන්ත්‍රික හා විදුලි උපකරණ | 1,301,655.80 | 431,764.65 |
| ගිවිසුම් සඳහා ගෙවීම් | 6,780,526.46 | 3,895,612.62 |
| පුහුණු කටයුතු සඳහා පහසුකම් සැපයිම - (කලාවැව) | 12,456,055.20 | 10,141,063.46 |
| නිති වියදම් | 1,603,470.00 | 974,221.25 |
| සුරතල් මසුන් වගාව පිළිබඳ පුහුණු වැඩමුළුව | 880,854.75 | 416,367.50 |
| විවිධ වියදම් | 156,723.00 | 884,573.73 |
| | 40,052,044.26 | 32,550,194.72 |
| එකතුව | 389,847,289.79 | 297,409,553.89 |

| දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා | 2015 | 2014 |
|---|---|---|
| | රු | රු |
| **සටහන - 16** | | |
| **බෙදා හැරීමේ පිරිවැය** | | |
| මොටර් රථ ප්‍රවාහන වියදම | 8,619,871.22 | |
| මත්ස්‍ය ඇඟිලිලන් ප්‍රවාහනය සඳහා ඉන්ධන වියදම | 2,539,526.50 | 11,725,451.08 |
| මොටර් රථ නඩත්තුව සඳහා වියදම | 10,493,491.92 | |
| ජලජීවී වගා සංවර්ධනය | 3,123,352.01 | 9,345,021.82 |
| ප්‍රදර්ශන වියදම් | 711,175.09 | |
| නීති විරෝධී මසුන් ප්‍රවාහනය පිළිබඳ වැටලීම් කටයුතු | 370,263.67 | |
| ඉස්සන් වගා කටයුතු පිළිබඳ වියදම | 1,893,478.98 | 13,988,214.78 |
| පරීක්ෂණ කට්ටල (PCR (Test kit)) | 6,398,898.23 | |
| වැඩමුළු - දේශීය හා විදේශීය | 3,422,454.34 | |
| වාහන බලපත්‍ර හා දුම් පරීක්ෂණ වියදම | 675,993.42 | 735,727.08 |
| මෝටර් රථ ක්ෂය වෙන් කිරීම | 6,350,871.36 | 5,687,399.72 |
| අඩමාණ ණය කපා හැරීම | 1,207,278.75 | - |
| අඩමාණ ණය ණයගැතියෝ | 1,554,649.14 | 1,057,742.08 |
| | 47,361,304.63 | 42,539,556.56 |
| ***සටහන - 17*** | | |
| ***මූල්‍ය පිරිවැය*** | | |
| බැංකු ගාස්තු | 93,910.53 | 67,321.46 |
| | 93,910.53 | 67,321.46 |

# මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන .

# ගිණුම්කරණ සටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 පොදු

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 1998 අංක 53 දරණ පනතින් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ස්ථාපිත කර ඇත.ප්‍රධාන කාර්යාලය අංක 41/1,නව පාර්ලිමේන්තු පාර,පැලවත්ත,බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා ව්‍යාපාර ස්වභාවය

අදාල වර්ෂයේදී ද ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ මත්ස්‍ය බීජ අලෙවිය වේ.

## 2 ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය පිලිබඳ සාරාංශය

### 2.1 ඉදිරිපත් කිරීමේ පදනම

ගිණුම් වාර්තා ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන ඉදිරිපත් කර ඇත.වර්ෂය තුලදී වත්කම් තුල ප්‍රත්‍යාගනන අගයන් ගැලපීම් හා උද්ධමනකාරී සාධක සඳහා ගැලපීම් සිදුකර නැත.

### 2.2 ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම

අධිකාරියේ ගිණුම් වාර්තා පොදුවේ පිලිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අධිකාරිය ස්ථාපිත කල 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනතේ අවශ්‍යතාවය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන මත සකස් කර ඇත.

### 2.3 සංසන්ධනාත්මක තොරතුරු

අධිකාරිය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව ආදේශ කර ඇති අතර පෙර වර්ෂවල භාවිතා කල ප්‍රතිපත්ති හා සැසඳේ.

### 2.4 වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළඳ කටයුතු වලින් ලැබියයුතු දෑ බොල් ණය හා අඩමාන ණය ගැලපීම් වලින් පසු ශුද්ධ වටිනාකම පෙන්නුම් කර ඇත. අනෙකුත් ලැබිය යුතු දෑ පිරිවැය මත හඳුනාගෙන ඇත.

### 2.5 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් සේ ඉදිරිපත් කර ඇත.

### 2.6 දේපල, පිරියත හා උපකරණ

ඉඩම් හැර අනෙකුත් වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ වටිනාකම පෙන්වා ඇත. වත්කමේ ජීවකාලය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ඇත. ක්ෂය ප්‍රතිශතයන් පහතින් දැක්වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 4% |
| වාහන | 20% |
| ලිබඩු සහ කාර්යාලීය | 10% |
| රසායනාගාර උපකරණ | 10% |
| යාන්ත්‍රික සහ අනෙකුත් උපකරණ | 10% |
| අභිජනනාගාර උපකරණ | 10% |
| මත්ස්‍ය තටාක | 10% |
| මත්ස්‍ය පොකුණු | 6% |
| උපකරණ සහ උපාංග | 10% |
| පරිගණක හා පණිඩවුඩ හුවමාරු උපකරණ | 20% |
| පරිගණක මෘදුකාංග | 10% |

*සටහන*

අධිකාරියේ හෙක්ටයාර 6.8799 ක ඉඩම් ස්ථාවර වත්කම් ලෙස ලබාගෙන නැත්තේ තක්සේරු කටයුතු සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට භාරදී ඇතත් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන ප්‍රත්‍යාගනන වාර්තා ලැබී නොමැති බැවිනි.

### 2.7 අඩමාන ණය

වර්ෂ අවසානයේ ඇති ණය ගැති ශේෂයෙන් 10% ක් අඩමාන ණය ලෙස වෙන්කර ඇත.

### 2.8 තොග

තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට ගණනය කර ඇත.

### 2.9 විශ්‍රාම පාරිතෝෂිත

*පාරිතෝෂිත බැදීම් අර්ථ දැක්වීම*

පාරිතෝෂිත ගණනය කර ඇත්තේ සේවයට බැදුනු දින සිට වර්ෂයට මාස 1/2 දල වැටුප බැගිනි. නමුත් 1983 අංක 12 දරණ පාරිතෝෂිත පනත අනුකූලව අධිකාරියේ වසර 5 ක් අඛණ්ඩව සේවයේ නියුක්ත නිලධාරීන් පමණක් පාරිතෝෂිත ලබාගැනීම සඳහා නීතියානුකූලව බැදේ.

*දායකත්ව සැලසුම් අර්ථ දැක්වීම-සේවක අර්ධ සාදක හා සේවක භාරකාර අරමුදල*

සේවකයන් සේවක අර්ධ සාදක අරමුදලට දායකවීම අනිවාර්ය අතර සේවක භාරකාර අරමුදල අදාල රෙගුලාසි අනුව සිදුකෙරේ.අධිකාරිය සේවක අර්ධ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දල ඉපැයීම් වලින් 15% ක හා 3% ක දායකත්වය දරනු ලබයි.

### 2.10 ආදායම් හඳුනා ගැනීම

ලැබිය යුතු හා ලද ආදයම සාධාරණ අගය මත සලකා ආදායම් ලෙස ගණනය කර ඇත.

### 2.11 වියදම් හඳුනා ගැනීම

ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස හඳුනා ගෙන ඇත්තේ එක් එක් ආදායම් ඉපැයීම් සඳහා දරා ඇති වියදම් වේ. සියලුම නිශ්පාදන ක්‍රියාවලිය සඳහා දරන ලද වියදම් හා දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම භාවිතය සඳහා නඩත්තු කිරීම් ආදායමට අයකිරීම තුලින් වර්ෂයට අදාල ලාභ/අලාභ අගය පැමිණ ඇත.

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
## ශේෂ පත්‍රය

| | සටහන් | 2015 රු | 2014 රු |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල ,පිරියතර හා උපකරන | 4 | 823,778,666.93 | 630,849,630.19 |
| අභිජනන ක්‍රියාවලියේ හා වෙළඳ වත්කම් | 5 | 285,364,959.02 | 133,074,104.93 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | | 17,463,020.30 | 47,187,303.03 |
| ජීව වත්කම් | | 99,950.00 | 99,950.00 |
| | | 1,126,706,596.25 | 811,210,988.15 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 6 | 27,383,281.52 | 22,876,016.69 |
| තැන්පතු, අත්තිකාරම් හා කලින් ගෙවීම් | 7 | 3,179,337.56 | 2,989,487.93 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 8 | 65,375,846.72 | 37,938,286.82 |
| මුදල් හා මුදලට සමාන දෑ | 9 | 49,268,312.68 | 11,591,440.47 |
| | | 145,206,778.48 | 75,395,231.91 |
| **මුළු වත්කම්** | | 1,271,913,374.73 | 886,606,220.06 |
| **හිමිකම් හා බැරකම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රාග්ධන හා වෙන් කිරීම් | | | |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන | | 158,514,594.24 | 207,003,656.89 |
| රැඳවා ගත් ඉපැයීම් | | (189,882,491.62) | (205,564,085.89) |
| | | 17,400,000.00 | 17,400,000.00 |
| **මුළු හිමිකම්** | | (13,967,897.38) | 18,839,571.00 |
| **බැරකම්** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම පාරිතෝශිත බැඳීම් | 10 | 70,918,812.89 | 53,562,763.88 |
| විලම්භිත ආදායම් | 11 | 1,091,547,414.97 | 702,648,721.18 |
| රාජ්‍ය ප්‍රදාන ව්‍යාපෘති (2006 අයවැය යෝජනා) | | 54,040,042.00 | 54,040,042.00 |
| | | 1,216,506,269.86 | 810,251,527.06 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 12 | 45,340,944.08 | 35,584,124.16 |
| කොන්ත්‍රාත් මත රැඳවා ගැනීම් | | 24,034,058.16 | 21,930,997.83 |
| | | 69,375,002.24 | 57,515,121.99 |
| **මුළු බැරකම්** | | 1,285,881,272.10 | 867,766,649.05 |
| **මුළු හිමිකම් හා බැරකම්** | | 1,271,913,374.73 | 886,606,220.06 |

පිටු අංක 01 සිට 03 දක්වා ගිණුම්කරන ප්‍රතිපත්තිද පිටු අංක 08 සිට 13 දක්වා ගිණුම්කරන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගෘහිත කොටසකි. මූල්‍ය වාර්ථා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙම ගිණුම්කරන වාර්ථාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලදි.

| | | |
|---|---|---|
| ................................ | ................................ | ................................ |
| නීතිඥ උපාලි මොහොට්ටි | පී.නිමල් චන්ද්‍රරත්න | ඒ.ටී.ගුණධීර |
| සභාපති | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ (මුදල්) |

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## ආදායම් ප්‍රකාශය

| | සටහන් | 2015<br>රු | 2014<br>රු |
|---|---|---|---|
| ආදායම | | 95,585,212.24 | 57,134,456 |
| මත්ස්‍ය අභිජනන ක්‍රියාවලියේ පිරිවැය | 13 | (83,002,781.06) | (60,305,736) |
| දළ අලාභය | | **12,582,431.18** | **(3,171,279)** |
| වෙනත් ආදායම | 14 | 51,941,769.97 | 43,320,266 |
| රාජ්‍ය ප්‍රදානයන් (පුනරාවර්ථන) | | 313,090,250.00 | 215,200,000 |
| | | **377,614,451.15** | **255,348,987** |
| ආයතනික හා පරිපාලන වියදම් | 15 | (389,847,289.79) | (297,409,554) |
| බෙදාහැරීමේ වියදම් | 16 | (47,361,304.63) | (42,539,557) |
| මුල්‍ය සහ වෙනත් වියදම් | 17 | (93,910.53) | (67,321) |
| | | **(437,302,504.95)** | **(340,016,432)** |
| විලම්භිත ආදායම් ගැලපීමට පෙර දළ අලාභය | | **(59,688,053.80)** | **(84,667,444)** |
| විලම්භිත ආදායම් | 10 | **71,131,086.25** | **58,339,603** |
| ශුද්ධ අලාභය | | **11,443,032.45** | **(26,327,842)** |

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2015<br>රු | 2014<br>රු. |
|---|---|---|
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය*** | | |
| ශුද්ධ ලාභ / අලාභ | 11,443,032.45 | (26,327,841.81) |
| ගැලපීම් | | |
| ක්ෂය - ස්ථාවර වත්කම් | 35,609,628.64 | 33,768,364.43 |
| ක්ෂය - අභිජනන උපකාර | 25,526,354.92 | 24,571,238.26 |
| අඩමාන ණය | 1,554,649.14 | 1,057,742.08 |
| පාරිතෝෂික වෙන් කිරීම් | 18,698,933.01 | 14,422,874.81 |
| පෙර වර්ෂ ගැලපීම් | 4,238,561.82 | - |
| වත්කම් විකුණුම් මත ලාභ | (4,694,898.00) | (3,260,187.96) |
| විලම්භිත ණය | (61,135,983.56) | (58,339,602.69) |
| කාරක ප්‍රාග්ධන ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය | 31,240,278.42 | (14,107,412.88) |
| (වැඩිවීම්) / අඩුවීම් තොග | (4,507,264.83) | (9,202,275.95) |
| (වැඩිවීම්) / අඩුවීම් අත්තිකාරම් හා කලින් ගෙවීම් | (189,849.63) | 3,267.69 |
| (වැඩිවීම්) / අඩුවීම් ණය ගැති හා අනෙකුත් ලැබීම් | (28,992,209.04) | (2,023,278.14) |
| (අඩුවීම් ) / වැඩිවීම් කොන්ත්‍රාත් මත රඳවා ගත් ලැබීම් | 2,103,060.33 | 9,633,615.99 |
| අඩුවීම් ) / වැඩිවීම් වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 9,756,819.92 | 293,833.56 |
| මෙහෙයුම් කටයුතු වලින් උපයන ලද මුදල් | 9,410,835.17 | (15,402,249.73) |
| පාරිතෝෂික ගෙවීම් | (1,342,884.00) | (2,091,771.75) |
| මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | **8,067,951.17** | **(17,494,021.48)** |
| ***ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය*** | | |
| දේපළ පිරියත හා මිලට ගැනුම් | (57,622,956.66) | (27,226,672.84) |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | (17,463,020.30) | (47,187,303.03) |
| ආයෝජන | - | - |
| දේපළ පරියත ඉවත් කිරීම් | 4,694,898.00 | 3,288,990.98 |
| ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය | **(70,391,078.96)** | **(71,124,984.89)** |
| ***මූල්‍ය කටයුතු මත මුදල් ප්‍රවාහය*** | | |
| ප්‍රාග්ධනය ප්‍රතිපාදන ලැබීම් (භාණ්ඩාගාර) | 100,000,000.00 | 95,000,000.00 |
| ආදායම් බදු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය | **100,000,000.00** | **95,000,000.00** |
| මුදල් , මුදල් හා සමාන ඓතමයන්ගෙන් වූ ශුද්ධ වැඩිවීම් / අඩුවීම් | **37,676,872.21** | **6,380,993.63** |
| වර්ෂ ආරම්භක මුදල් , මුදල් හා සමාන ඓතමයන්ගේ වටිනාකම | **11,591,440.47** | **5,210,446.84** |
| වර්ෂ අවසාන මුදල් , මුදල් හා සමාන ඓතමයන්ගේ වටිනාකම | **49,268,312.68** | **11,591,440.47** |
| ***මුදල්, මුදල් හා සමාන ඓතමයන්ගේ විග්‍රහය*** | | |
| වර්ෂ අවසානයට | | |
| බැංකු ශේෂය | 49,268,312.68 | 11,591,440.47 |
| මුදල් ශේෂය ( අතැති මුදල්) | - | - |
| | 49,268,312.68 | 11,591,440.47 |
| බැංකු අයිරාව | - | - |
| | **49,268,312.68** | **11,591,440.47** |

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | රාජ්‍ය ප්‍රදානයන් | | වත්කම් ප්‍රත්‍යාගණන අරමුදල | රඳවා ගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | | | |
| 2014.01.01 දිනට ශේෂය | - | 139,230,329.73 | 17,400,000.00 | (179,236,244.07) | (22,605,914.34) |
| රාජ්‍ය ප්‍රදානයන් | 215,200,000.00 | 95,000,000.00 | - | - | 310,200,000.00 |
| විලම්භිත ආදායමට මාරු කිරීම් (2014 වර්ෂයට අදාලව) | - | (27,226,672.84) | 0.00 | - | (27,226,672.84) |
| ලාභාලාභ ගිණුමට මාරු කිරීම් | (215,200,000.00) | - | - | - | (215,200,000.00) |
| වර්ෂයේ ශුද්ධ ලාභ/අලාභ | - | - | - | (26,327,841.81) | (26,327,841.81) |
| **2014.12..31 දිනට ශේෂය** | **-** | **207,003,656.89** | **17,400,000.00** | **(205,564,085.89)** | **18,839,571.00** |
| | | | | | |
| 2015.01.01 දිනට ශේෂය | - | 207,003,656.89 | 17,400,000.00 | (205,564,085.89) | 18,839,571.00 |
| රාජ්‍ය ප්‍රදානයන් - පුනරාවර්ථන හා ප්‍රග්ධන | 313,090,250.00 | 100,000,000.00 | 0.00 | - | 413,090,250.00 |
| රාජ්‍ය ප්‍රදානයන් - ඉරණමඩු අභජනන මධ්‍යස්ථානය ඉදිකිම | - | 280,780,717.39 | 0.00 | - | 280,780,717.39 |
| මුදලින් නොවන රාජ්‍ය ප්‍රදානයන් | - | 30,760,000.00 | 0.00 | - | 30,760,000.00 |
| විලම්භිත ආදායමට මාරු කිරීම් (2014 වර්ෂයට අදලව) | - | (460,029,780.04) | 0.00 | - | (460,029,780.04) |
| ලාභාලාභ ගිණුමට මාරු කිරීම් | (313,090,250.00) | - | - | - | (313,090,250.00) |
| පෙරවර්ෂ ගැලපුම් | 0.00 | - | - | 4,238,561.82 | 4,238,561.82 |
| වර්ෂයේ ශුද්ධ ලාභ/අලාභ | - | - | - | 11,443,032.45 | 11,443,032.45 |
| **2015.12..31 දිනට ශේෂය** | **-** | **158,514,594.24** | **17,400,000.00** | **(189,882,491.62)** | **(13,967,897.38)** |

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

2015 දෙසැම්බර් මස 31 දිනට ස්ථාවර වත්කම්

සටහන 4

දේපල පිරියත හා උපකරණ

| පිරිවැය | 2015.01.01 දිනට ශේෂය | වර්ෂය තුල එකතු කිරීම් | වර්ෂය තුල ඉවත් කිරීම් | 2015.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් | 146,411,854.00 | - | - | 146,411,854.00 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 381,773,586.07 | 181,933,712.98 | - | 563,707,299.05 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (ADB) | 206,460,717.00 | - | - | 206,460,717.00 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (නව ගොඩනැගිල්ල ) | 3,184,404.00 | - | - | 3,184,404.00 |
| ලිබඩු සහ කාර්යාලීය | 32,654,981.22 | 7,359,124.95 | - | 40,014,106.17 |
| ලිබඩු සහ කාර්යාලීය (ADB) | 4,911,820.00 | - | - | 4,911,820.00 |
| රසායනාගාර උපකරණ | 10,137,482.80 | 3,536,535.90 | - | 13,674,018.70 |
| යාන්ත්‍රික සහ අනෙකුත් උපකරණ | 22,518,850.66 | 4,017,603.00 | - | 26,536,453.66 |
| පරිභෝජන ද්‍රව්‍ය සහ විවිධ උපකරණ | 10,137,648.96 | - | - | 10,137,648.96 |
| උපකරණ සහ උපාංග | 1,573,467.00 | - | - | 1,573,467.00 |
| වාහන | 56,628,401.91 | 30,919,741.95 | 3,287,300.00 | 84,260,843.86 |
| වාහන (ADB) | 38,833,274.00 | - | 639,370.00 | 38,193,904.00 |
| පරිගණක හා පණිඩවුඩ හුවමාරු උපකරණ | 8,755,954.99 | 2,118,700.00 | - | 10,874,654.99 |
| පරිගණක මෘදුකාංග | 1,155,625.00 | - | - | 1,155,625.00 |
| | **925,138,067.61** | **229,885,418.78** | **3,926,670.00** | **1,151,096,816.39** |

| ක්ෂය | 2015.01.01 දිනට ශේෂය | වර්ෂය තුල එකතු කිරීම් | වර්ෂය තුල ඉවත් කිරීම් | 2015.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් | - | - | - | 0.00 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 105,005,753.67 | 15,270,943.45 | - | 120,276,697.12 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (ADB) | 49,550,572.08 | 8,258,428.68 | - | 57,809,000.76 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (නව ගොඩනැගිල්ල ) | 3,184,404.00 | - | - | 3,184,404.00 |
| ලිබඩු සහ කාර්යාලීය | 18,982,859.60 | 2,415,814.61 | - | 21,398,674.21 |
| ලිබඩු සහ කාර්යාලීය (ADB) | 2,947,092.00 | 491,182.00 | - | 3,438,274.00 |
| රසායනාගාර උපකරණ | 6,864,963.32 | 577,826.45 | - | 7,442,789.77 |
| යාන්ත්‍රික සහ අනෙකුත් උපකරණ | 14,808,057.72 | 1,346,753.40 | - | 16,154,811.12 |
| පරිභෝජන ද්‍රව්‍ය සහ විවිධ උපකරණ | 7,344,422.14 | 860,934.62 | - | 8,205,356.76 |
| උපකරණ සහ උපාංග | 1,573,001.29 | 466.00 | - | 1,573,467.29 |
| වාහන | 39,462,692.93 | 6,350,871.36 | 3,287,300.00 | 42,526,264.29 |
| වාහන (ADB) | 38,833,274.00 | - | 639,370.00 | 38,193,904.00 |
| පරිගණක හා පණිඩවුඩ හුවමාරු උපකරණ | 5,388,996.46 | 1,271,761.47 | - | 6,660,757.93 |
| පරිගණක මෘදුකාංග | 342,348.22 | 111,400.00 | - | 453,748.22 |
| | **294,288,437.42** | **36,956,382.04** | **3,926,670.00** | **327,318,149.46** |
| ලියාහල අගය | **630,849,630.19** | | | **823,778,666.93** |

සටහන 5

අභිජනන ක්‍රියාවලියට අදාල වත්කම්

| පිරිවැය | 2015.01.01 දිනට ශේෂය | වර්ෂය තුල එකතු කිරීම් | වර්ෂය තුල ඉවත් කිරීම් | 2015.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| අභිජනනාගාර උපකරණ | 12,283,745.87 | 3,775,712.56 | - | 16,059,458.43 |
| අභිජනනාගාර උපකරණ (ADB) | 84,246,743.00 | - | - | 84,246,743.00 |
| මත්ස්‍ය තටාක | 28,781,971.19 | 11,829,342.29 | - | 40,611,313.48 |
| මත්ස්‍ය පොකුණු | 225,993,310.20 | 160,865,400.76 | - | 386,858,710.96 |
| | **351,305,770.26** | **176,470,455.61** | **-** | **527,776,225.87** |

| ක්ෂය | 2015.01.01 දිනට ශේෂය | වර්ෂය තුල එකතු කිරීම් | වර්ෂය තුල ඉවත් කිරීම් | 2015.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| අභිජනනාගාර උපකරණ | 6,186,364.95 | 799,029.09 | - | 6,985,394.04 |
| අභිජනනාගාර උපකරණ (ADB) | 33,698,697.20 | 8,424,674.30 | - | 42,123,371.50 |
| මත්ස්‍ය තටාක | 8,477,342.80 | 2,708,851.52 | - | 11,186,194.32 |
| මත්ස්‍ය පොකුණු | 169,869,260.38 | 12,247,046.61 | - | 182,116,306.99 |
| | **218,231,665.33** | **24,179,601.52** | **-** | **242,411,266.85** |
| ලියාහල අගය | **133,074,104.93** | | | **285,364,959.02** |

| දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා | 2015 | 2014 |
|---|---|---|
| | රු | රු |
| **සටහන - 6** | | |
| **තොගය** | | |
| ලිපි ද්‍රව්‍ය | 213,245.72 | 464,559.53 |
| මත්ස්‍ය ආහාර | 4,213,920.80 | 4,194,412.00 |
| රසායනික ද්‍රව්‍ය හා හෝර්මෝන | 15,377,662.40 | 5,199,753.16 |
| මත්ස්‍ය බීජ | 3,864,130.60 | 9,561,507.00 |
| මච් මත්ස්‍ය තොග | 3,714,322.00 | 3,455,785.00 |
| | 27,383,281.52 | 22,876,016.69 |
| **සටහන - 7** | | |
| **තැන්පතු අත්තිකාරම් සහ කලින් ගෙවීම්** | | |
| **තැන්පතු** | | |
| තැන්පතු (විදුලි බල මණ්ඩලය) | 1,290,750.00 | 1,290,750.00 |
| තැන්පතු (NAQDA) | 292,290.00 | 292,290.00 |
| | 1,583,040.00 | 1,583,040.00 |
| **අත්තිකාරම්** | | |
| අත්තිකාරම් - විශේෂ | 258,050.00 | 37,784.50 |
| අත්තිකාරම් - ඉන්ධන | 183,200.00 | 81,700.00 |
| අත්තිකාරම් - සුළු මුදල් | 8,400.00 | - |
| අත්තිකාරම් - උත්සව | 92,250.00 | 858,431.73 |
| අත්තිකාරම් - ණය පොත් | 3,850.00 | 9,761.25 |
| අත්තිකාරම් - දේශීය මිලදී ගැනීම් | 1,050,547.56 | 418,770.45 |
| | 1,596,297.56 | 1,406,447.93 |
| | | |
| | 3,179,337.56 | 2,989,487.93 |
| **සටහන - 8** | | |
| **වෙළඳ හා අනෙකුත් ලැබීම්** | | |
| **වෙළඳ ණයගැතියෝ** | | |
| මාළු අලෙවි ණයගැතියෝ | 12,772,747.09 | 8,429,438.84 |
| අඩු කළා: අඩමාණ ණය ගැතියෝ | (3,484,143.90) | (1,929,494.76) |
| | 9,288,603.19 | 6,499,944.08 |
| **අනෙකුත් ලැබීම්** | | |
| ණය ගැතියෝ (පෞද්ගලික රාජ්‍ය හවුල් ව්‍යවසාය) | 329,120.70 | 329,120.70 |
| ලැබිය යුතු බදු කුලිය | 403,593.75 | 1,612,284.63 |
| රක්ෂණාවරණය | - | 8,000.00 |
| පෙර ගෙවුම් | 9,489,165.78 | - |
| ඉරණමඩු අභිජනනාගාරය ඉදිකිරීම | 10,042,202.08 | 9,475,017.65 |
| විසිතුරු මත්ස්‍ය කර්මාන්ත සංවර්ධනය | 365,333.41 | - |
| මීරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය | 148,450.25 | - |
| කුඩා පරිමාණ මඩ පොකුණු මධ්‍යස්ථාන | 4,803.89 | - |
| | 20,782,669.86 | 11,424,422.98 |
| **ණය ගැතියෝ - NAQDA සේවක** | | |
| ආපදා ණය මුදල | 34,497,332.03 | 19,781,669.76 |
| යතුරු පැදි ණය | 807,241.64 | 232,250.00 |
| | 35,304,573.67 | 20,013,919.76 |
| **සටහන - 9** | | |
| **අතැති මුදල් හා බැංකුවල ඇති ශේෂයන්** | | |
| මහජන බැංකුව (පුනරාවර්තන) - 208100483320761 | 8,199,884.28 | 850,282.93 |
| මහජන බැංකුව (ප්‍රාග්ධන) - 208100393320761 | 5,891,641.72 | 193,392.92 |
| ලංකා බැංකුව (Mis. Deposit) - 0003270048 | 6,507,121.49 | 2,437,307.98 |
| මහජන බැංකුව (Distress Loan) - 208100113320761 | 962,054.57 | 186,413.25 |
| මහජන බැංකුව (Pro./ Mis.) - 208100203320761 | 14,110,472.94 | 1,018,969.08 |
| මහජන බැංකුව (කලාවැව) - 179-1-001-2-0000458 | 327,155.58 | 137,418.21 |
| ලංකා බැංකුව (දිවි නැගුම) - 0072520724 | 12,901,381.64 | 6,079,236.99 |
| මහජන බැංකුව (JICA) - 208-1-005-7-3320761 | 121,732.85 | 121,732.85 |
| මහජන බැංකුව (යතුරු පැදි අරමුදල) - 208-1-001-3-0022301 | 246,867.61 | 566,686.26 |
| | 49,268,312.68 | 11,591,440.47 |